## 2023/02/14 දින පැවති මහාසභා රැස්වීම් වාර්තාව

2023/02/14 දින පෙ.ව. 09.30 ට නාගොඩ ප්‍රදේශීය සභා රැස්වීම් ශාලාවේදී රැස්වීම පවත්වන ලදී.

**සහභාගී වූ**

1. නිමල් වික්ටර් නාගොඩවිතාන මහතා — ගරු සභාපති
2. එම්.කේ. ගාමිණී සුසන්ත මහතා — ගරු උප සභාපති
3. ඒ.එච්.වී. අජිත් කුමාර මහතා — ගරු මන්ත්‍රී
4. ඩබ්. ජී. නිශාන්ත මහතා — ගරු මන්ත්‍රී
5. සී.වී. සහබන්දු මහතා — ගරු මන්ත්‍රී
6. බන්දුල සමන්ත හිරිමුතුගොඩ — ගරු මන්ත්‍රී
7. එච්.ජී. තරංග සුදර්ශන මහතා — ගරු මන්ත්‍රී
8. කුමාරගේ වසන්ත මහතා — ගරු මන්ත්‍රී
9. එච්.කේ.ලක්රුවන් සම්පත් මහතා — ගරු මන්ත්‍රී
10. එන්.ජී. ගයාන් මධුෂංඛ මහතා — ගරු මන්ත්‍රී
11. ධර්මසිරි ගනේවත්ත මහතා — ගරු මන්ත්‍රී
12. පියල් හිරිමුතුගොඩ මහතා — ගරු මන්ත්‍රී
13. එඩේරආරච්චි වෙරංග ලක්මාල් මහතා — ගරු මන්ත්‍රී
14. නාපෙ විතානගේ සමන් මහතා — ගරු මන්ත්‍රී
15. සී. වනිගරත්න මහතා — ගරු මන්ත්‍රී
16. විලේගේ අමර ධනංජය මහතා — ගරු මන්ත්‍රී
17. ප්‍රියන්තා ගුණසේකර මහත්මිය — ගරු මන්ත්‍රිනී
18. එම්.එම්.දිසානායක මහතා — ගරු මන්ත්‍රී
19. එන්.ඩබ්. පතිනායක මහතා — ගරු මන්ත්‍රී
20. විජිත් වීරගුණරත්න සහබන්දු මහතා — ගරු මන්ත්‍රී
21. කේ.කේ.අයි.නෙරංජලී මහත්මිය — ගරු මන්ත්‍රිනී
22. කේ.ඒ.සී. දිල්රුක්ෂි මහත්මිය — ගරු මන්ත්‍රිනී
23. එච්.එච්. ගයන්ති කුමාරි මහත්මිය — ගරු මන්ත්‍රිනී
24. ඩබ්. කේ. නෙළී මහත්මිය — ගරු මන්ත්‍රිනී
25. පී.ජී. රංජිත් ජයවීර මහතා — ගරු මන්ත්‍රී
26. ප්‍රියංගිකා දිල්රුක්ෂි ඒකනායක — ගරු මන්ත්‍රිනී

**සහභාගි නොවූ**

01. සුභාෂි මධුමාලි ඒකනායක මෙනවිය — ගරු මන්ත්‍රිනී

**01.** **ආගම සිහි කිරීම**

2023.02.14 දින මහා සභාව ආරම්භ කිරීමට පළමුව පැමිණ සිටි සියලු දෙනා තම තමන්ගේ ආගම සිහි කිරීමෙන් අනතුරුව මිය ගිය ඥාතීන් රණවිරුවන් සිහිපත් කර විනාඩියක නිශ්ශබ්දතාවයක් පළ කළේය

**02. මූලාසනයේ පිළිගැනීමේ කතාව**

ගරු උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රීවරුනි, මන්ත්‍රීවරියනි, සියලු දෙනාගෙන් අවසරයි. මේ වර්ෂයේ දෙවන සභාවාරය අද දින පවත්වන්නෙ ඒ වගේම ඉදිරි පළාත් පාලන ජන්ද විමසීම පැවැත්වීමට නියමිතව තිබෙනව විවිධ පක්ෂ වලින් අපි ජන්දය ඉල්ලුවත් විවිධ ගැටලුකාරී තත්ත්වයන්ට පත් නොවී අපි එකාවන්ව කටයුතු කරයි කියල බලාපොරොත්තු වෙනව. ඒ අනුව අද දින මහා සභා රැස්වීමට සපැමිණි ඔබතුමන්ලා සහ ඔබතුමියන්ලා මම ඉතා ගෞරවයෙන් පිළිගනු ලබනවා. එහෙමනම් වෙනදා වගේ සභා රැස්වීමේ කටයුතු ආරම්භ කරමු.

**(අ)01. 2023.01.10 දින පැවති මහ සභා වාර්තාවේ නිවැරදි කිරීම් ඇත්නම් ඒවා නිවැරදි කර වාර්තාව ස්ථිර කිරීම.**

**(අ)02. පසුගිය වාර්තාවේ සංශෝධන ඉදිරිපත් කිරීම**

**නැත.**

**2023.01.10 දින පැවති මහා සභාවේ සභා වාර්තාව සභාව පිළිගතයුතු සත්‍ය වාර්තාවක් ලෙස ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතා විසින් යෝජනා කළ අතර, ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.**

**(ආ). සභාපතිතුමා විසින් කරනු ලබන විශේෂ නිවේදන**

අද දින ගරු මන්ත්‍රිනී සුභාෂි මධුමාලි ඒකනායක මෙනවිය සහභාගි නොවන බවත් එතුමියගේ නිවාඩු අනුමත කර දෙන ලෙසත් දුරකථනයෙන් දැනුම්දෙනු ලැබුව එම නිවාඩු අනුමත කරදෙන ලෙස ගරු සභාවට යෝජනා කර සිටිනව ,

**ඒ අනුව ගරු සභාපති නිමල් වික්ටර් නාගොඩවිතාන මහතා විසින් ගරු මන්ත්‍රිනී සුභාෂි මධුමාලි ඒකනායක මෙනවියට 2023.02.14 දින නිවාඩු අනුමත කරන ලෙස ගරු සභාවට කළ යෝජනාව ගරු උපසභාපති එම් .කේ.ගාමිණී සුසන්ත මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභාසම්මතවිය.**

**(ඇ). සන්දේශ, පෙත්සම්, පැමිණිලි ,ලිපි ඉදිරිපත් කිරීම**

01. 219 ඩී අලුත්වත්ත ග්‍රාම සංවර්ධන සමිතිය විසින් 2023.02.23 දිනැතිව යොමු කරන ලද අලුත්වත්ත මංසන්ධියේ ඇති රජයේ ඉඩමේ සති පොළ පැවත්වීමට අවසර ලබා දීම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.

02. 219 ඩී අලුත්වත්ත ග්‍රාම සංවර්ධන සමිතිය විසින් 2023.02.23 දිනැතිව අලුත්වත්ත මංසන්ධියේ ඇති රජයේ ඉඩමේ සති පොළ 2023.02.16 දින පැවත්වීමට නියමිත බැවින් එම භූමියේ කසළ ඉවත් කිරීමට උදව් උපකාර කරන ලෙසත්, එහි ප්‍රචාරක කටයුතු සඳහා ඔබතුමාගේ ආයතනයෙන් එලවුන්ස් කටයුතු සිදු කර දෙන ලෙසත් ඉල්ලා යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

03. පී.වී. අනෝමා සංජීවනි, 18 කණුව අලුත්වත්ත, නාකියාදෙණිය විසින් උඩුගම සතිපොළෙහි ජනවාරි මාසයට අදාළ බදු මුදල සම්පූර්ණ ටෙන්ඩර් මුදලින් අඩු කිරීමට වූ ඉල්ලීම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.

04. දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ප්‍රාදේශීය සභාවට අයත් මාර්ගයන්හි නඩත්තු කටයුතු සඳහා පෙරමුසු ලබාදීම සම්බන්ධව 2023.02.02 දිනැතිව යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

**(ඇ) යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න.**

01. 2023 වර්ෂයට අදාලව උඩුගම සතිපොළ බදු අයිතිය පැවරීම සම්බන්ධවයි.
2023 වර්ෂයට අදාලව උඩුගම සතිපොළ ටෙන්ඩර් කිරීම 2023.01.06 දින නාගොඩ ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී සිදුකරන ලදී .එහිදීඅවම ලංසුව රු.6000000 ක් වූ අතර වැඩිම වටිනාකමක් රු. 620,000.00) ක් ඉල්ලුම් කර තිබූ කේ.එච්.එම්. ඉනෝකා දමයන්ති වෙත බදු අයිතිය පැවරීම සිදු කරන ලදී. එසේ වුවද ඉන් පසු එම තැනැත්තිය සභාවට අනුයුක්තව සේවය කරන සේවක මහතකුගේ විවාහක බිරිඳ වන බව දුරකථන ඇමතුමකින් ලද පැමිණිල්ලක් පිළිබඳව මහා සභාවේදී කරුණු විමසීමක් සිදු කල අතර, එහිදී ඒ පිළිබඳව අභ්‍යන්තර පරික්ෂාවක් සිදු කරන ලදී. එහිදී පෞද්ගලික ලිපිගොනුවට අදාළ ලේඛන සම්බන්ධව සිදු කල පරික්ෂාවේදී එම කරුණු සත්‍ය බවට සනාථ වූ අතර, එම ටෙන්ඩරය වහාම අවලංගු කිරීමට තීරණය කරන ලදී. ඒ අනුව නැවත වරක් 2023.01.27 දින ටෙන්ඩර් කැඳවීම සිදු කර 2023.02.01 දින උඩුගම සතිපොළෙහි බදු අයිතිය වෙනත් අයෙකුට පැවරීම සිදු කරන ලදී.
ඉහත නම් සඳහන් කේ.එච්.එම්. ඉනෝකා දමයන්ති මිය විසින් උඩුගම පොළ ටෙන්ඩර් කිරීමේදී අය කරන ලද ආපසු ගෙවීමේ තැන්පතු මුදල වන රු. 5000.00 ආරක්ෂිත ඇප තැන්පතු මුදල වූ රු. 155,000.00 ක මුදල සම්බන්ධව තීරණයක් ලබා දෙන ලෙස ගරු සභාවෙන් ඉල්ලා සිටිමි.

**(ඉ). (1) යථා පරිදි කල් දී ඇති යෝජනා**

01.මාපලගම මහජන ක්‍රීඩාංගනයේ දිවා රාත්‍රී වොලිබෝල් ක්‍රීඩාපිටියට විදුලිය ලබා ගැනීම සඳහා විදුලි පහන් කණු ස්ථාපිත කිරීමට අදාළ රු. 1,650,000.00 ක ඇස්තමේන්තුව සහා අනුමැතිය සඳහා යෝජනා කරමි.
**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා විසින් ස්ථිරකරනු ලදුව ඒකමතිකව සභාසම්මත විය .**

**11(08) යටතේ ඉදිරිපත් කරන යෝජනා**
02. සභාව සතු ඇල මාර්ගවල රක්ෂිත ප්‍රදේශ සම්බන්ධවයි.

| ඇළහි මතු පිට පළල (මීටර්) | ඇළ ඉවුරේ මායිමේ සිට රක්ෂිතය | |
|---|---|---|
| | විවෘත ඇළ සඳහ (මීටර්) | මතුපිට ආවරණය කරන ලද ඇළ මාර්ග සඳහ (මීටර්) |
| 1.0-1.2 දක්වා | 1.0 | 0.3 |
| 1.3-3.0 | 2.0 | 1.0 |
| 3.1-4.5 | 2.75 | 1.0 |
| 4.6-6.0 | 3.5 | 1.5 |
| 6.1-9.0 | 4.5 | 1.5 |
| 9.0 ට වැඩි | 6.5 | 2.0 |

ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල ගොඩනැගිලි ඉදිකිරීම් සැළසුම් අනුමත කිරීමේදී සභාව සතු ඇළ මාර්ගවල ඉහත සඳහන් රක්ෂිත ප්‍රදේශ සීමාවන් යෝජනා කරමි.
**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපති එම්.කේ. ගාමිණී සුසන්ත මහතා විසින් ස්ථිරකරනු ලදුව ඒකමතිකව සභාසම්මත විය .**

03. 2023 වර්ෂයේ සභා ස්ථිර පෙර පාසල් ගුරුවරියන් 03 දෙනෙක් විශ්‍රාම යෑමට නියමිත බැවින්, කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් වැඩිම සේවා කාලයක් සහිත පහත සඳහන් ගුරුවරියන් සම්මුඛ පරීක්ෂණයට යොමු කිරීමට ගරු සභාවට යෝජනා කරමි.

| | | |
|---|---|---|
| i. | අජන්තා දීපානි මිය | වසර 14 |
| ii. | යමුනා අබේසිංහ | වසර 11 |
| iii. | දේශානි ප්‍රියානි | වසර 11 |
| iv. | පී.කේ. සෝමලතා | වසර 10 |
| v. | කේ.පී.ක්‍රිෂ්ණා සඳමාලි | වසර 09 |
| vi. | නිසංසලා මධූෂාණී වනිගරත්න | වසර 09 |
| vii. | ජී.පී.ශ්‍රියානි | වසර 10 |

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපති එම්.කේ. ගාමිණී සුසන්ත මහතා විසින් ස්ථිරකරනු ලදුව ඒකමතිකව සභාසම්මත විය .**

04. නාගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට ඇතුළු වන මායිම් ස්ථානවල මායිම සටහන් වන හා ප්‍රාදේශීය සභාව හඳුන්වන පුවරු ප්‍රදර්ශනය කිරීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්න මහතා විසින් ස්ථිරකරනු ලදුව ඒකමතිකව සභාසම්මත විය .**

05. නාගොඩ රාජකීය ජාතික පාසලේ ආදිශිෂ්‍ය සංගමය මගින් පවත්වනු ලබන අධ්‍යාපන හා වෙළඳ ප්‍රදර්ශනය සහ සංගීත සංදර්ශනය බලපත්‍ර ගාස්තු සහ විනෝද බද්දෙන් නිදහස් කිරීම සම්බන්ධව 2022.12.12 දිනැති ලිපිය සභාවට යොමු කල අතර,විධිමත් තීරණයක් ගත යුතු බැවින් 2023 පෙබරවාරි මස 22,23,24,25 සහ 26 දිනයන්හි නාගොඩ රාජකීය විද්‍යාලය මගින්පවත්වනු ලබන අධ්‍යාපන හා වෙළඳ ප්‍රදර්ශනය සහ සංගීත සංදර්ශනය බලපත්‍ර ගාස්තු සහ විනෝද බද්දෙන් නිදහස් කිරීමට සුදුසුබවටත් එමනිදහස්කරන සම්පූර්ණ බදු මුදල ඍජුව පාසලේ ආදාල බලධාරීන් වෙත ලැබිය යුතුයැයි වන මෙම යෝජනාව ගරු සභාවට යෝජනා කරමි.
**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී විජිත් සහබන්දු මහතා විසින් ස්ථිරකරනු ලදුව ඒකමතිකව සභාසම්මත විය .**

06. . ආහාර සුරක්ෂිතතාවය සහ පෝෂණය පිළිබඳ දකුණු පළාත් සැලැස්ම යටතේ වතු පෙරපාසල් සඳහා දියර කිරිවීදුරුවක් ලබාදීමේ වැඩසටහන දෙසැම්බර් මස වතු පෙරපාසල් දරුවන් 177 දෙනෙකු සඳහා නාගොඩ ප්‍රාදේශීය සභාවේ මූලිකත්වයෙන් සිදු කෙරිණි. එහිදී දියර කිරි වැඩසටහන සඳහා පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රධාන යටතේ ප්‍රතිපූර්ණය වන මුදලට අමතරව කිරිසැපයුම් කරුවන්ට ගෙවියයුතු රු.24660.00 ක මුදල සභා අරමුදලින් වියදම් කිරීමට සුදුසුයැයි ගරු සභාවට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා විසින් ස්ථිරකරනු ලදුව ඒකමතිකව සභාසම්මත විය .**

07. 2022.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සිදු කරන ලද භාණ්ඩ සමීක්ෂණයට අදාල වාර්තාව පිළිගැනීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව අඩුපාඩු නිවැරදි කර ඉදිරි සභාවාරයට යොමුකර අනුමැතිය ලබා ගැනීමට තීරණය විය.**

08. 2022.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සිදු කරන ලද භාණ්ඩ සමීක්ෂණයෙන් ඉදිරිපත් කරනු ලබන යෝජනාව සම්මත වීමෙන් අනතුරුව තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා අපහරණ හා වෙන්දේසි කමිටුවට මන්ත්‍රීවරුන් තිදෙනෙක් පත් කිරීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සදහන් යෝජනාව සම්බන්ධව ඉදිරිසභාවාරයට යොමුකර අනුමැතිය ලබා ගැනීමට තීරණය විය.**

09. 2022.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමීක්ෂණයෙන් ඉවත් කරනු ලබන භාණ්ඩ වෙන්දේසි කිරීමට දිනයක් ලබා ගැනීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සදහන් යෝජනාව සම්බන්ධව ඉදිරිසභාවාරයට යොමුකර අනුමැතිය ලබා ගැනීමට තීරණය විය.**

10.2018 වර්ෂයේ මාපලගම ආසිරි ටයර් සර්විස් ආයතනය අසල ඇති ප්‍රධාන මාර්ගයේ කාණු පද්ධතිය පිළිසකර කර එම කානු පද්ධතියේ වතුර ගඟ කරා බැස යාමට සැලසියයුතු බව යෝජනාවක් සභාවට යෝජනා කර අතර එම යෝජනාව ස්ථිර වී ගරු සභාපතිතුමාගේ දැන්වීම පරිදි මා සහ වෙනත් රාජ්‍ය ආයතන එක්වී කාණු පද්ධතිය පිළිසකර කරන ලදි .එම අවස්ථාවේදී ඒ අසල නිවසක් තනා සිටින දයාවතී හෙට්ටි ආරච්චි නැමැති අය විසින් මා හට බද්දේගම උසාවියේ ඉහත නඩු අංකයට නඩු පවරන ලදී .එම නඩුව සම්බන්ධ තොරතුරු පහතින් දැක්වේ.

- බද්දේගම දිසා අධිකරණය නඩු අංක SP/138 නඩුව සම්බන්ධව නඩු ගාස්තු වශයෙන් පී.ඒ යමුනි ප්‍රියංගනී නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස්, රෝහල ඉදිරිපිට, බද්දේගම.විසින් නඩුව සම්බන්ධ විස්තර වාරතාවක් මෙසේ ඉදිරිපත්කොට ඇත. මෙම නඩුවේ 1 වන විත්තිකරු ලෙස නම්කර ඇති මාපලගම කොට්ඨාශයේ ප්‍රාදේශීය සභා මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ යන අය වෙනුවෙන් මාගේ පෙනී සිටීම සහ අනෙකුත් ගාස්තු පිළිබඳව අදාල ගෙවීම් ලද බවට දන්වා ඇත.ඒ අනුව

| | |
|---|---|
| • පෙරකලාසි ගොනුකිරීම සඳහා මුද්දර ගාස්තු | රු.1000.00 |
| • 2020/12/10 දින පෙනී සිටීම (පෙරකලාසි ගොනුකිරීම) | රු.3000.00 |
| • 2021/02/05 දින පෙනී සිටීම (කොමිසමට පියවර) | රු.3000.00 |
| • 2021/07/09 දින පෙනී සිටීම (කොමිසන් වාර්තා) | රු.3000.00 |
| • 2021/10/01 දින පෙනී සිටීම (කොමිසන් වාර්තා) | රු.3000.00 |
| • 2022/01/21 දින පෙනී සිටීම (කොමිසන් වාර්තා) | රු.3000.00 |
| • 2022/05/06 දින පෙනී සිටීම (කොමිසන් වාර්තා) | රු.3000.00 |
| • 2022/09/01 දින පෙනී සිටීම (කොමිසන් වාර්තා) | රු.3000.00 |
| • 2022/11/24 දින පෙනී සිටීම (කොමිසන් වාර්තා) | රු.3000.00 |
| මුළු මුදල | = රු.25000.00 |

නඩු ගාස්තු වශයෙන් වියදම්වූ ඉහත සඳහන් රු .25000.00 මුදල මාහට සභා අරමුදලින් ලබා දීමට කටයුතු කරන ලෙස යෝජනා කරමි.

**ඒ අනුව ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී ගයාන් මධුෂංඛ මහතා විසින් ස්ථිරකරනු ලදුව ඒකමතිකව සභාසම්මත විය .**

**11. I. ඉදිරි ගෙවීම් වාර්තාව ඉදිරිපත් කිරීම**

**නාගොඩ ප්‍රාදේශීය සභාව**

**2023.02.14 වන දින පවත්වනු ලබන මහසභා රැස්වීම සඳහා ඉදිරිපත් කළ යුතු ඉදිරි ගෙවීම් වාර්තාව**

**01. සභාපති, නාගොඩ ප්‍රාදේශීය සභාව, නාගොඩ**

I. 2023 ජනවාරි මස මන්ත්‍රීවරුන් සඳහා ඉන්ධන ලබා ගැනීමේ බිල්පත - රු. 81,000.00

II. 2023.01.20 දින පැවති පරිසර කමිටුවට සහභාගී වූ සාමාජිකයින් සඳහා දීමනා ගෙවීම - රු. 3000.00

III. කුරුපනාව පහල වතුරාව ඩී.ජී. අශෝකා මහත්මියගේ නිවසට අනතුරුදායකව පැවති පොල් ගස කපා ඉවත් කිරීම සඳහා ලබාගත් අත්තිකාරම් පියවීම - රු. 4,500.00

IV. සභාවට අවශ්‍ය මුද්‍රිත ද්‍රව්‍ය වෙනුවෙන් බිල්පත පියවීම - රු. 5613.72

**02. චන්දිමා සෙනෙවිරත්න මිය, ලේකම්, නාගොඩ ප්‍රාදේශීය සභාව** - රු. 9,164.66

රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක **sp/psc/07/01/08(37)** හා 2022.02.07 දිනැති ලිපිය අනුව ලේකම් තනතුරෙහි වැඩ බැලීම වෙනුවෙන් 2023 ජනවාරි මස දීමනා ගෙවීම

**03. විගණකාධිපති, ජාතික විගණන කාර්යාලය, අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල**

2010 වර්ෂය සඳහා හිඟ විගණන ගාස්තු ගෙවීම - රු.10,000.00

**04. ජාතික ජල සම්පාදන හා ජලප්‍රවාහන මණ්ඩලය**

ජල සැපයුම විසන්ධි කිරීම නැවත යථා තත්වයට පත් කිරීම.උඩුගම උප කාර්යාලය -රු.26020.28

**05. රෙජිස්ටාර් ජනරාල්, රෙජිස්ටාර් ජනරාල් දෙපාර්තමේන්තුව, ගාල්ල**

i. 2020 නොවැම්බර් හා 2020 දෙසැම්බර් මාස 2 සඳහා පිළියෙල කරන ලද මුද්දර ගාස්තු උපලේඛන සකස් කිරීමට අදාළ ගෙවීම් - රු. 11,700.00

ii. 2021 පෙබරවාරි හා 2021 මාර්තු මාස 2 සඳහා පිළියෙල කරන ලද මුද්දර ගාස්තු උපලේඛන සකස් කිරීමට අදාළ කාර්ය මණ්ඩල දීමනා ගෙවීම් - රු. 12,500.00

**06. කේ.පී. ප්‍රදීපා නිල්මිණී,රිවර් ෆෙයා, නාගොඩ, ගාල්ල**

නාගොඩ කැකුලු පෙර පාසල පවත්වාගෙන යනු ලබන ගොඩනැගිල්ල සඳහා 2023 පෙබරවාරි මස බදු කුලිය ගෙවීම - රු.6,000.00

**07. නීතිඥ හේමන්ත පී. ඩබ්. විතාරණ මයා, අංක 24, ලේන්බාන් වීදිය, කොටුව, ගාල්ල**

I. 2023.12.13 එල් 36 නඩුවට අදාළව නීතිඥ ගාස්තු, කොමිෂන් බලපත්‍ර සකස් කිරීමේ ගාස්තු - රු.22,000.00

**08. එම්.ජේ. ජනිත් ඉරේෂ් කුමාර, ජාගොඩ කේක් ඇන්ඩ් ස්වීට්ස්, ඉහළ ලේලවල, ගා/ වඳුරඹ**

2023.01.10 දින පැවති මහ සභා වාරය සඳහා සංග්‍රහ වියදම් බිල්පත පියවීම -රු. 16330 .00

**09. ජේ.පී. කොමියුනිකේෂන්, නාගොඩ.**

2023 ජනවාරි මස සභා වාර්තා පිටපත් 28ක් මුද්‍රණය කිරීම වෙනුවෙන් බිල්පත් පියවීම - රු.2,844.00

**10.**ඒ.ජේ.ජී. ස්ටේෂනරීස්, ගාල්ල
නාගොඩ ප්‍රාදේශීය සභාව සඳහා අවශ්‍ය ලිපිද්‍රව්‍ය මිළදී ගැනීමේ බිල්පත - රු. 240,398.00

**11.ඒ.කේ.නිලන්ති සජීවනී මිය, ග්‍රාෆ්ටෙල් කමියුනිකේෂන්, යටලමත්ත**
2023 ජනවාරි මස මන්ත්‍රීවරුන් සඳහා දුරකතන කාඩ්පත් ලබා ගැනීමේ බිල්පත -රු.28,500.00

**12.**ශ්‍රීනිත් රුක්ෂාන් මයා, සමගිගම, උඩුගම
උඩුගම මහජන පුස්තකාලය සඳහා මස පුවත්පත් මිළදී ගැනීම 2023 ජනවාරි - රු. 9,520.00

**13.**ඒ.ඩී. කරුණාරත්න මයා, සරත් ස්ටෝර්ස්, යටලමත්ත
නාගොඩ මහජන පුස්තකාලය සඳහා මස පුවත්පත් මිළදී ගැනීම 2023 ජනවාරි - රු. 13,550.00

**14.සෙලෙක්ස් කම්පියුටර්, කිතුලම්පිටිය, ගාල්ල**
ආයතනයට අවශ්‍ය ඇඟිලි සළකුණු යන්ත්‍රය මිළදී ගැනීමේ බිල්පත - රු. 54,500.00

**15.එක්සලන්ට් ඇඩ්ස් ඇන්ඩ් කා කෙයා, නව නගරය, තල්ගස්වල**
සභාවට අවශ්‍ය සීල් හා තල්ගස්වල පොළ භූමියේ ප්‍රදර්ශනයට අවශ්‍ය
ඩිජිටල් බැනර් සඳහා බිල්පත පියවීම - රු. 3,350.00

**16.ලංකා තෙල් පිරවුම්හල, නාගොඩ**
**නාගොඩ ප්‍රාදේශීය සභාවේ වාහන සහ අනෙකුත් අවශ්‍යතා සඳහා ඉන්ධන ලබා ගැනීමේ බිල්පත පියවීම 2022 දෙසැම්බර් - රු. 457,500.00**

| දිනය | වාහන අංකය | ඇණවුම් අංකය | වර්ගය | ප්‍රමාණය (l) | වටිනාකම (රු.) |
|---|---|---|---|---|---|
| 2022.12.02 | PF 7360 කැබ්රථය | 370400 | ඩීසල් | 55 | 23,650.00 |
| 2022.12.05 | | 789753 | | 51 | 21,930.00 |
| 2022.12.08 | | 789756 | | 56 | 23,520.00 |
| 2022.12.11 | | 789757 | | 50 | 21,000.00 |
| 2022.12.14 | | 789760 | | 40 | 16,800.00 |
| 2022.12.16 | | 789762 | | 59 | 24,780.00 |
| 2022.12.18 | | 789763 | | 35 | 14,700.00 |
| 2022.12.20 | | 789766 | | 53 | 22,260.00 |
| 2022.12.22 | | 789767 | | 61 | 25,620.00 |
| 2022.12.26 | | 789771 | | 52 | 21,840.00 |
| 2022.12.30 | | 789773 | | 50 | 21,000.00 |
| | | | **එකතුව** | **562** | **237,100.00** |
| 2022.12.14 | LL 7650 කෘ කැබ් රථය | 789759 | ඩීසල් | 40 | 16,800.00 |
| 2022.12.20 | | 789765 | | 50 | 21,000.00 |
| | | | **එකතුව** | **90** | **37,800.00** |
| 2022.12.05 | LL 7366 ට්‍රක් ජල බවුසරය | 789751 | ඩීසල් | 50 | 21,500.00 |
| 2022.12.24 | | 789770 | | 50 | 21,000.00 |
| | | | **එකතුව** | **50** | **42,500.00** |

| | | | | | |
|---|---|---|---|---|---|
| 2022.12.05 | SPRA 8570 ට්‍රැක්ටරය | 789752 | ඩීසල් | 40 | 17,200.00 |
| 2022.12.12 | | 789758 | | 40 | 16,800.00 |
| 2022.12.16 | | 789761 | | 40 | 16,800.00 |
| 2022.12.23 | | 789768 | | 40 | 16,800.00 |
| 2022.12.28 | | 789772 | | 35 | 14,700.00 |
| | | | **එකතුව** | **195** | **82,300.00** |
| 2022.12.28 | SPRA 8570 ට්‍රැක්ටරය | 789772 | DS 40 oil | 02 | 3,000.00 |
| 2022.12.20 | 252-6478 | 789764 | ඩීසල් | 60 | 25,200.00 |
| 2022.12.23 | | 789769 | | 40 | 16,800.00 |
| | | | | 100 | 42,000.00 |
| 2022.12.06 | ගබඩා කර තබා ගැනීම සඳහා | 789755 | පෙට්‍රල් | 25 | 9,250.00 |
| 2022.12.06 | ගබඩා කර තබා ගැනීම සඳහා | 789755 | 2 T Oil | 01 | 1,700.00 |
| 2022.12.06 | සභා වාර්තා බෙදා දීම සඳහා | 789754 | පෙට්‍රල් | 5 | 1850.00 |
| | | | **මුළු එකතුව** | | **457,500.00** |

**<u>2022.12.06 සිට 2022.12.31 දක්වා සංශෝධිත මිළ ක්‍රියාත්මක වේ</u>**

**17. අබේනායක ඔටෝ සර්විස්, ගාල්ල**
SPPF 7360 කැබ් රථය සේවා කිරීමේ බිල්පත - රු.46,620.00

**18. විජිත් වරුණ ගුණසේකර, වරුණ සර්විස් සෙන්ටර්, මාපලගම**
SPLL 7650 කෘ කැබ් රථය සේවා කිරීමේ බිල්පත - රු. 37,575.00

**19. ඩී.ජී. කැළුම් පුෂ්පකුමාර මයා, උඩුගම මෝටර් ඉංජිනියර්ස්, උඩුගම**
252-6478 කැබ් රථයේ බ්‍රේක් පද්ධතිය අළුත්වැඩියා කිරීමේ බිල්පත - රු. 67,000.00

**20. ඊ.ඒ. සමන් කුමාර මයා, එදිරිසිංහ මෝටර්ස්, උඩුගම**
252-6478 කැබ් රථයේ අළුත්වැඩියාව සම්බන්ධ බිල්පත පියවීම - රු. 9,500.00

**21. කේ.ටී.ආර්.ජී. උමාල් කිරිඇල්ල මයා, ග්‍රෑන්ඩ් මෝටර්ස්, වදුරඹ**

**i.** SPPF 7360 කැබ් රථයේ බ්‍රේක් පෑඩ් අලුතින් දැමීමේ බිල්පත - රු. 17,750.00

**ii.** SPPF 7360 කැබ් රථයේ බ්‍රේක් පද්ධතියේ කැලිපර් රෙපෙයාර් කිට් එක දැමීම සහ බ්‍රේක් පිස්ටන් යෙදීමේ බිල්පත - රු. 22,700.00

**22.** **දයානි ට්‍රේඩ් සෙන්ටර්, මාපලගම**

i. ප්‍රාදේශීය සභාවේ තණකොළ කපන මැෂින් සඳහා ඇක්සලේටර් වෙනුවෙන් බිල්පත පියවීම - රු. 520.00

ii. ප්‍රධාන කාර්යාලය හා උප කාර්යාලය සඳහා අවහය විල්බැරෝ 02 ක් මිළ දී ගැනීමේ බිල්පත - රු. 11,000.00

**23.** **සී.බී. ජාගොඩ, නාගොඩ**

සෞඛ්‍ය කම්කරුවන් හා වැඩ/ක්ෂේත්‍ර කම්කරුවන් සඳහා අවශ්‍ය සබන්

මිළදී ගැනීමේ බිල්පත - රු. 29453.76

**24.** **යශෝධරා රශිනි නාගොඩවිතාන මෙය, ආනන්දගිරි, නාගොඩ , ගාල්ල**

සභාපතිතුමාගේ මහජන සම්බන්ධතා නිලධාරී දීමනාව ගෙවීම 2023 ජනවාරි **- රු.** 14,500.00

**25.** **සාමාන්‍යාධිකාරී, ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව, කොළඹ 10**

දුම්රිය බලපත්‍ර බිල්පත් සඳහා මුදල් ගෙවීම - රු. 109,350.00

**26.එච්.වී, තම්දු මධුමාල්, ලේකම්, අභිමන් මිතුරු සංසදය, උඩුගම**

රිසිට් අංක 14448 යටතේ ගෙවූ උඩුගම ක්‍රීඩාංගනය භාවිතය වෙනුවෙන් ගෙවූ විදුලි ගාස්තුව විදුලිය ලබා නොගැනීම නිසා නැවත ගෙවීම - රු. 2,000.00

**27.** **<u>2023 ජනවාරි මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම (ක්ෂේත්‍ර නිලධාරින් සඳහා)</u>**

| | | | |
|---|---|---|---|
| I. | කේ.ඩී.එස්.නිපුනිකා මිය | - සංවර්ධන නිලධාරී | - රු. 6,000.00 |
| II. | ඩබ්.ජේ.ඒ. ශානක මයා | - ආදායම් පරීක්ෂක | -රු. 4,000.00 |
| III. | කේ.ඒ.එදිරිසිංහ මයා | - තාක්ෂණ නිලධාරී | - රු.5,500.00 |
| IV. | කේ.එල්.නදුන් ප්‍රමෝද් මයා | - තාක්ෂණ නිලධාරී | - රු. 3,660.00 |
| V. | අනුෂා සමරවික්‍රම මිය | - තාක්ෂණ නිලධාරී | - රු. 3135.00 |
| VI. | කේ.පී.ජී. මධුෂා හේමචන්ද්‍ර මිය | - සංවර්ධන නිලධාරී | - රු. 3150.00 |

**28.** **<u>2023 පෙබරවාරි මස ගමන් වියදම්</u>**

<u>ආයතනයේ රාජකාරි ගමන්වල නියලීම වෙනුවෙන්</u>

| | | | |
|---|---|---|---|
| I. | කේ.කේ.අවන්ත පද්ම මයා | - කාර්යාල කාර්ය සහායක | -රු.1750.00 |

**<u>2023 ජනවාරි මස ගමන් වියදම්</u>**

<u>ආයතනයේ රාජකාරි ගමන්වල නියලීම වෙනුවෙන්</u>

| | | | |
|---|---|---|---|
| I. | නිමල් වික්ටර් නාගොඩවිතාන මයා | - ගරු සභාපති | -රු.3,000.00 |
| II. | කේ.ඩී.එස්.නිපුනිකා මිය | - සංවර්ධන නිලධාරී | - රු.7,040.00 |
| III. | කේ.කේ.අවන්ත පද්ම මයා | - කාර්යාල කාර්ය සහායක | - රු.6,490.00 |
| IV. | ඩබ්.ජේ.ඒ. ශානක මයා | - ආදායම් පරීක්ෂක | -රු 550.00 |
| V. | එම්. ඒ. වසන්ත මයා | - රියදුරු | -රු. 5,600.00 |
| VI. | අනුර දිසානායක මයා | - රියදුරු | - රු1,050.00 |

**29.** **<u>අතිකාල දීමනා ගෙවීම්</u>**

**<u>2023 ජනවාරි මස</u>**

| | | |
|---|---|---|
| එම්.ඒ.වසන්ත මයා | - රියදුරු | **- රු.** 9,226.40 |
| අනුර දිසානායක මයා | - රියදුරු | - රු. 4,739.64 |
| කේ. එච්.එම් නිශාන්ත ඉඳුනිල් | - රියදුරු | - රු. 8,435.41 |

| | | |
|---|---|---|
| කේ.එච්.එම්. කැළුම් චාමර | - රියදුරු | - රු. 1,719.32 |
| ඩී.ටී.ආර්.ඒ. තරිඳු ගුණරත්න මයා | - මුරකරු | - රු. 6,726.56 |
| ඩබ්.කේ. සම්පත් සංජීව මයා | - අනියම් රියදුරු | - රු. 8,059.32 |
| එන්.එම්.රජිත් මයා | - අනියම් මුරකරු | - රු. 5,254.14 |
| අයි.කේ.ඉන්දික මයා | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු | - රු. 2,367.18 |
| යූ.ජී. රංජිත් උදය කුමාර මයා | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු | - රු. 3,390.62 |
| කේ.ජී.හර්ෂ චාමර සම්පත් මයා | - සෞඛ්‍ය කම්කරු | -රු. 4,976.28 |
| එස්.ඩී.එම්.කැටිපෙආරච්චි මයා | - විදුලි කාර්මික | - රු. 1,157.20 |
| යූ.ජී. ආසිරි අභය කුමාර මයා | - සෞඛ්‍ය කම්කරු | - රු. 7,274.97 |

**දස මස් වැටුප් අත්තිකාරම්**

**30.** ඩී.ජී. තිලානි මේබලා මිය, පෙර පාසල් ගුරු - රු. 250,000.00

**ඒ අනුව ඉදිරි ගෙවීම් වාර්තාවේ සඳහන් අංක 1 –30 දක්වා සියළු ඉදිරි ගෙවීම්වලින් අංක 20 යටතේ ඇති ඉදිරි ගෙවීම හැර ඉතිරි සියළු ඉදිරි ගෙවීම් සහා අරමුදල් මගින් ගෙවීම සුදුසු බව ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා විසින් යෝජනා කල අතර, ගරු මන්ත්‍රිනී නෙලී වක්වැල්ල මහත්මිය විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සහා සම්මත විය.**

.................................................................................................................................................

**11.ii**

**2023.02.14 දින පවත්වනු ලබන මහ සහාරැස්වීම සඳහා ඉදිරිපත් කරනු ලබන ආවරණ අනුමැතිය යටතේ සිදු කල ගෙවීම් වාර්තාව**

1. එච්.එල්.කේ ශ්‍රීනිත් රුක්ෂාන් , උඩුගම.
   2022 දෙසැම්බර් මස උඩුගම පුස්තකාලයට පුවත්පත් සැපයීමේ බිල්පත පියවීම රු. 10230.00

2. බී.එස්.ඒ ලසන්ත ධනංජය, කුරුන්ද,උඩුගම.
   නාගොඩ ප්‍රාදේශීය සහාවට අයත් මාර්ගය පළුදු කර ජලනල එලීම වෙනුවෙන් තැන්පත් මුදල් ආපසු ගෙවීම රු.3500.00

3. ශ්‍රී ලංකා ටෙලිකොම් පී.එල්.සී
   2022 දෙසැම්බර් මස දුරකථන බිල්පත් පියවීම
   0912296577 - මාපලගම උපකාර්යාලය රු. 574.40
   0912296537 - ප්‍රධාන කාර්යාලය රු. 3988.72
   0912231201 - සභාපතිතුමාගේ නිවස රු. 5304.39
   0912296433 - ප්‍ර ධාන කාර්යාලය
   රු. 2436.38
   2022 නොවැම්බර් මස දුරකථන බිල්පත් පියවීම
   0912231201- සභාපතිතුමාගේ නිවස රු. 5853.89

4. පෝස්ට් මාස්ටර් ජනරාල් ගිණුම් අංක 0131199027346 ට බැර
   2023 ජනවාරි මස තැපැල් ගාස්තු ගෙවීම රු. 10000.00

5. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය
ජල බිල්පත් ගෙවීම (2022.12.13-2023.01.11 දක්වා)
33/53/003/008/11 උඩුගම උපකාර්යාලය රු. 805.00
33/53/003/009/10 උඩුගම බහු කාර්ය මධ්‍යස්ථානය රු. 9136.96
33/53/001/069/11 උඩුගම පොල රු. 1182.20

6. මහජන බැංකුවේ ලංකා විදුලිබලමණ්ඩල ගිණුම
2022 දෙසැම්බර් මස විදුලි බිල්පත් පියවීම
2809093105 - කොම්පෝස්ට් ව්‍යාපෘතිය රු. 1087.18
8617046104 - උඩුගම බහු කාර්ය මධ්‍යස්ථානය රු. 702.57
4594192913 - උඩුගම උපකාර්යාලය රු. 1189.75
4591713210 - ප්‍රධාන කාර්යාලය රු. 9645.13
2810125104 - දීප්ති පෙර පාසල රු. 394.88
2813189405 - තල්ගස්වල පෙර පාසල රු. 420.52
8619142704 - රන්කැකුලු පෙර පාසල රු. 404.76
2810236100 - මාපලගම කරුණාතිලක ක්‍රීඩාංගනය රු. 728.21
4593739918 - මාපලගම උපකාර්යාලය රු. 548.72
4501090200- මාපලගම වෙළඳ සංකීර්ණ කොරිඩෝව රු. 574.36
4507357802 - සමණල පෙරපාසල රු. 369.24

7. සභාපති, නාගොඩ ප්‍රාදේශීය සභාව
කුරුපනාව අශෝකා අයිරාංගනී මහත්මියගේ නිවසට අනතුරු දායකව පවතින පොල්ගස කපා ඉවත්කිරීම සඳහා කැපුම් ගාස්තුවට අත්තිකාරම් මුදල් ලබා ගැනීම රු. 4500.00

**ඒ අනුව ආවරණ අනුමැතිය යටතේ ගෙවීම් කර ඇති ඉහත සඳහන් අංක 1 –7 දක්වා ගෙවීම් සභාව පිළිගත හැකි බවට ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා විසින් යෝජනා කල අතර, ගරු මන්ත්‍රිනී නෙලී වක්වැල්ල මහත්මිය විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**(ඉ) 3. ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම**

01. ඇප්තොප්වත්ත PC 30 එක්ස්කවේටර් යන්ත්‍රයක් යොදා සංවර්ධනය කිරීම
අදියර IV -රු. 60,000.00
02. කපල්විල ප්‍රදේශයේ ඇති ප්‍රජාශාලාව ප්‍රතිසංස්කරණය කිරීම - රු. 200,000.00

**ඉහත සඳහන් ඇස්තමේන්තු සභාව පිළිගත යුතු බවට ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතා විසින් යෝජනා කල අතර, ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**(ඉ) 4. මිළ ගණන් ඉදිරිපත් කිරීම**

**01 පෙර පාසල් නිල ඇඳුම් සඳහා ලැබී ඇති මිළ ගණන්**

| අනු අංකය | විස්තරය | ගිහාන් ඇපරල් පුද්. සමාගම,ගාල්ල | මහේන්ද්‍ර ලොරොන්සුහේවා, ගාල්ල | නිව් ලෝරන්ස් ෆැෂන්ස්, උඩුගම |
|---|---|---|---|---|
| 01 | ගැහැණු නිල ඇඳුම් | රු. 1350.00 | රු. 1300.00 | රු. 1200.00 |
| 02 | පිරිමි නිල ඇඳුම් | රු. 1350.00 | රු. 1300.00 | රු. 1200.00 |

පෙර පාසල් නිල ඇඳුම් සඳහා ලැබී ඇති මිළ ගණන් අනුව අවම මිළ ගණන් ඉදිරිපත් වූ නිව් ලෝරන්ස් ෆැෂන්ස්, උඩුගම. වෙතින් පෙර පාසල් නිල ඇඳුම් ගැනීම සුදුසු බවට ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා යෝජනා කරන ලද අතර, ගරු උප සභාපති එම්.කේ. ගාමිණී සුසන්ත මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**02.** තණකොල කපන මැෂින් එකේ අමතර කොටස් සඳහා ලැබී ඇති මිළ ගණන්

| අනු අංකය | විස්තරය | එච්.බී. ඉංජිනියරින්, උඩුගම |
|---|---|---|
| 01 | ජියර් හෙඩ් | 8250.00 |
| 02 | බෝර් පිස්ටන් | 9300.00 |
| 03 | ඔයිල් සීල් | 350.00 |
| 04 | කැන්ක් | 4600.00 |
| 05 | ඇක්ස්ලේටර් කේබල් | 2500.00 |
| 06 | ක්ලච් | 3150.00 |
| 07 | ප්ලග් | 1185.00 |
| 08 | ඉග්නීෂියන් කොයිල් | 3800.00 |
| 09 | රිකොයිල් ස්ටාටර් | 3200.00 |
| 10 | මැෂින් 3 අලුත්වැඩියා කිරීම සඳහා | 10500.00 |
| | එකතුව | **46935.00** |

තණකොල කපන මැෂින් එකේ අමතර කොටස් සඳහා ලැබී තිබූ මිළ ගණන් අනුව එකම මිළ ගණන් ඉදිරිපත් කල එච්.බී. ඉංජිනියරින්, උඩුගම විසින් තණකොල කපන මැෂින් එකේ අමතර කොටස් මිළදී ගැනීම සුදුසු බවට ගරු මන්ත්‍රී ගයාන් මධුසංඛ මහතා යෝජනා කරන ලද අතර, ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**03.** විදුලි උපකරණ සඳහා ලැබී ඇති මිළ ගණන්

| අනු අංකය | විස්තරය | වාසනා ඩීලර්ස්, පින්නදූව | දයානි ට්‍රේඩ් සෙන්ටර්, මාපලගම | කේ.එම්.ටී. ඩිස්ට්‍රිබියුටර්ස්, යක්කලමුල්ල |
|---|---|---|---|---|
| 01 | 12.5 W LED | 1270.00 (ORANGE) | 1150.00 (PILIPS) | 1450.00 (ORANGE) |
| 02 | 20W LED | 2730.00 (ORANGE) | 1975.00 (PILIPS) | 2990.00 (ORANGE) |
| 03 | 2 PIN HOLDER | 220.00 (ORANGE) | 80.00<br>210.00 – POLICROME | 235.00 (ORANGE) |

විදුලි උපකරණ සඳහා ලැබී තිබූ මිළ ගණන් අනුව අවම මිළ ගණන් ඉදිරිපත් කල වාසනා ඩීලර්ස්, පින්නදූව වෙතින් විදුලි උපකරණ මිළදී ගැනීම සුදුසු බවට ගරු මන්ත්‍රිනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය

යෝජනා කරන ලද අතර, ගරු මන්ත්‍රී විජිත් සහබන්දු මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සහා සම්මත විය.

**04.** පොහොර මිළදී ගැනීම සඳහා ලැබී තිබූ මිළ ගණන්

| අනු අංකය | විස්තරය | සුගත් ස්ටෝර්ස්, උඩුගම | ප්‍රමිති පොහොර, නාගොඩ |
|---|---|---|---|
| 01 | කුරුඳු පොහොර | 255.00 | 260.00 |
| 02 | යූරියා | 380.00 | 390.00 |
| 03 | ත්‍රිත්ව සුපර් පොස්පේට් | | 30.00 |
| 04 | මියුරියේට් ඔෆ් පොටෑෂ් | | 500.00 |

පොහොර මිළදී ගැනීම සඳහා ලැබී තිබූ මිළ ගණන් අනුව ආයතනයට අවශ්‍ය සියළුම පොහොර වර්ග ඉදිරිපත් කල ප්‍රමිති පොහොර, මාපලගම පාර, නාගොඩ, ගාල්ල. වෙතින් මිළදී ගැනීම සුදුසු බවට ගරු මන්ත්‍රිනී ප්‍රියංගිකා දිල්රුක්ෂි ඒකනායක මහත්මිය විසින් යෝජනා කරන ලද අතර, ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සහා සම්මත විය.

**05.** නාගොඩ ප්‍රාදේශීය සභාවට අවශ්‍ය ඉදල් සඳහා ලැබී තිබූ මිළ ගණන්

| අනු අංකය | විස්තරය | අබේධීර | සුගත් ස්ටෝර්ස්, උඩුගම | සරත් චතුරංග, උඩුගම |
|---|---|---|---|---|
| **01** | ඉදල් | **240.00** | **220.00** | **250.00** |

නාගොඩ ප්‍රාදේශීය සභාවට අවශ්‍ය ඉදල් මිළදී ගැනීමට ලැබී තිබූ මිළ ගණන් අනුව අවම මිළ ගණන් ඉදිරිපත් කල සුගත් ස්ටෝර්ස්, උඩුගම විසින් නාගොඩ ප්‍රාදේශීය සභාවට අවශ්‍ය ඉදල් මිළදී ගැනීම සුදුසු බවට ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා මහතා යෝජනා කරන ලද අතර, ගරු මන්ත්‍රිනී පියංගිකා දිල්රුක්ෂි ඒකනායක මහත්මිය විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සහා සම්මත විය.

**06.** නාගොඩ ප්‍රාදේශීය සභාවට අවශ්‍ය ටයර් මිළදී ගැනීම සඳහා ලැබී ඇති මිළ ගණන්

| අනු අංකය | විස්තරය | නිව් විජය මෝටර්ස්, ගාල්ල | ගෝල් බැටරි හවුස්, ගාල්ල |
|---|---|---|---|
| 01 | ටයර් size 650x16<br><br>Tube | 41000.00<br><br>4650.00 | 42500.00<br><br>4750.00 |
| 02 | ටයර් size 600x16 (8 Nylon)<br><br>Tube | 33300.00<br><br>5400.00 | 36000.00 |
| 03 | ටයර් size 205R16C | 71300.00 | 72500.00 |

නාගොඩ ප්‍රාදේශීය සභාවට අවශ්‍ය ටයර් මිළදී ගැනීමට ලැබී තිබූ මිළ ගණන් අනුව අවම මිළ ගණන් ඉදිරිපත් කල නිව් විජය මෝටර්ස්, ගාල්ල. වෙතින් නාගොඩ ප්‍රාදේශීය සභාවට අවශ්‍ය ටයර් මිළදී ගැනීම සුදුසු බවට ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා යෝජනා කරන ලද අතර, ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සහා සම්මත විය.

**07.** නාගොඩ ප්‍රාදේශීය සභාවට අවශ්‍ය වයි කණු මිළදී ගැනීම සදහා ලැබී ඇති මිළ ගණන්

| අනු අංකය | විස්තරය | සී/ස බද්දේගම ප්‍රා. සංවර්ධන සමුපකාර සමිතිය |
|---|---|---|
| **01** | අඩි **07** වයි කණු | **2450.00** |
| **02** | අඩි **08** වයි කණු | **2800.00** |

නාගොඩ ප්‍රාදේශීය සභාවට අවශ්‍ය වයි කණු මිළදී ගැනීමට ලැබී තිබූ මිළ ගණන් අනුව එකම මිළ ගණන් ඉදිරිපත් කල සී/ස බද්දේගම ප්‍රා. සංවර්ධන සමුපකාර සමිතිය විසින් නාගොඩ ප්‍රාදේශීය සභාවට අවශ්‍ය වයි කණු මිළදී ගැනීම සුදුසු බවට ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා යෝජනා කරන ලද අතර, ගරු මන්ත්‍රිනී නෙලී වක්වැල්ල මහත්මිය විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සහා සම්මත විය.

**08.** නාගොඩ ප්‍රාදේශීය සභාවට අවශ්‍ය ලිපි ද්‍රව්‍ය මිළදී ගැනීම සදහා ලැබී ඇති මිළ ගණන්

| අනු අංකය | විස්තරය | පැරගන් ස්ටෙෂනරීස්, ගාල්ල | ඒ.ජේ.ජී. ස්ටෙෂනරීස්, ගාල්ල | ගමගේ බුක් ෂොප්, බද්දේගම |
|---|---|---|---|---|
| 01 | Box File | 408.00 | 421.90 | 540.00 |
| 02 | Box Holder | 418.00 | 456.00 | 445.00 |
| 03 | 369 ස්ටෙප්ලර් කටු පැකට් | 79.00 | 55.00 | 66.00 |
| 04 | ස්ටික් නෝට් ( තනි කොළය) | 90.00 | 80.00 | 135.00 |
| 05 | ස්ටික් නෝට් (තීරු සහිත කොළය) | 90.00 | 105.00 | 135.00 |
| 06 | රෝනියෝ ෂීට් | 2200.00 | 2090.00 | |
| 07 | ඩබල් ටේප් | 160.00 | 276.00 | 69.00 |
| 08 | සී.ආර්. 160 (තනිරූල්) | 329.00 | 322.35 | 345.00 |
| 09 | සී.ආර්.200 (තනිරූල්) | 424.00 | 420.00 | 427.00 |
| 10 | ක්ෂේත්‍ර සටහන් පොත් | 128.00 | 118.00 | 130.00 |
| 11 | ප්ලැටිග්නම් | 210.00 | 396.00 | 208.00 |
| 12 | මකන | 20.00 | 12.50 | 19.50 |
| 13 | තනිරූල් පිටු 40 පොත් | 62.00 | 51.15 | 115.00 |

නාගොඩ ප්‍රාදේශීය සභාවට අවශ්‍ය ලිපිද්‍රව්‍ය මිළදී ගැනීමට ලැබී තිබූ මිළ ගණන් අනුව අවම මිළ ගණන් ඉදිරිපත් කල පැරගන් ස්ටෙෂනරීස්, ගාල්ල විසින් නාගොඩ ප්‍රාදේශීය සභාවට අවශ්‍ය ලිපිද්‍රව්‍ය මිළදී ගැනීම සුදුසු බවට ගරු මන්ත්‍රී අජිත් එඬේරආරච්චි මහතා යෝජනා කරන ලද අතර, ගරු උපසභාපති එම් .කේ ගාමිණී සුසන්ත මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සහා සම්මත විය.

**09.** **නාගොඩ ප්‍රාදේශීය සභාවට අවශ්‍ය පහත සඳහන් ද්‍රව්‍ය සඳහා ලැබී ඇති මිළ ගණන්**

| අනු අංකය | විස්තරය | ග්ලාස් සෙන්ටර් ඇන්ඩ් ටයිල් ෂෝ රූම් | රංජිත් ට්‍රේඩර්ස්, මාපලගම | දයානි ට්‍රේඩර්ස්, මාපලගම |
|---|---|---|---|---|
| 01 | තාච්චි | 300.00 | 310.00 | 275.00 |
| 02 | හෝස් (අගල් 1/2,දිග මීටර් 50) | මීටර් 15 -3000.00<br>මීටර් 30 - 5000.00 | මීටර් 15– 3200.00 | මීටර් 15- 2650.00<br>මීටර් 30- 4750.00 |
| 03 | කාපට් අතුල්ලන බ්‍රෂ් | 200.00 | 200.00 | 120.00 |
| 04 | ටයර් අතුල්ලන බ්‍රෂ් | 220.00 | 250.00 | 200.00 |

**නාගොඩ ප්‍රාදේශීය සභාවට අවශ්‍ය ඉහත සඳහන් ද්‍රව්‍ය මිළදී ගැනීමට ලැබී තිබූ මිළ ගණන් අනුව අවම මිළ ගණන් ඉදිරිපත් කල දයානි ට්‍රේඩර්ස්, මාපලගම විසින් නාගොඩ ප්‍රාදේශීය සභාවට අවශ්‍ය ද්‍රව්‍ය මිළදී ගැනීම සුදුසු බවට ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා යෝජනා කරන ලද අතර, ගරු මන්ත්‍රී ප්‍රියංගිකා දිල්රුක්ෂි මහත්මිය විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**(ඊ) කාරක සභා වාර්තා**

2023.01.30 දින පවත්වන ලද ප්‍රසම්පාදන කමිටු වාර්තාව සත්‍ය වාර්තාවක් ලෙස සභාගත කරන ලදී.

**(උ). ලැබීම් හා ගෙවීම් වාර්තා**

01. 2023 ජනවාරි මස ආදායම් ලැබීම් හා වියදම් ගෙවීම් වාර්තාව සත්‍ය වාර්තාවක් ලෙස සභාගත කරන ලදී.

**(ඌ) වෙනත් කරුණු**

**ගරු මන්ත්‍රිනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය**
ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රීතුමියන්ලාගෙන් හා මන්ත්‍රීතුමන්ලාගෙන් අවසරයි. පසුගියදා මගේ පියාගේ අවමංගල්‍ය උත්සවයට සහභාගී වූ ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලා සියලු දෙනාට අපගේ පවුලේ ස්තූතිය සහ මාගේ ස්තූතිය මේ අවස්ථාවේදී පිරිනමනවා. ඒ වාගේම මගේ කොට්ඨාශ භාර මන්ත්‍රීතුමා ඒ සම්බන්ධව සෑහෙන්න වෙහෙසිලා කටයුතු කළා. මේ අවස්ථාවේ එතුමාවත් සිහිපත් කරමින්, සියළු දෙනාටම ස්තූතිය පුදකරමින්, මම නිහඬ වෙනවා.

**ගරු මන්ත්‍රී වසන්ත කුමාරගේ මහතා**
ගරු සභාපතිතුමා ඇතුළු සමස්ත සභාවෙන් අවසරයි. මම පළමුවෙන්ම ප්‍රකාශ කරන්නේ ප්‍රියන්තා මන්ත්‍රීතුමියගෙ පියාගෙ මේ මළගම පිළිබඳව සභාව හැටියට අපිව දැනුවත් කළේ නැහැ. ඒ සම්බන්ධව දැඩි සේ කණගාටුවට පත්වෙනවා. මාගේ හදවතින්ම නැගෙන සංවේගය ප්‍රකාශයට පත් කරනවා.
ඒ වගේම සභාපතිතුමනි, මේ වෙලාවේ නාගොඩ ප්‍රාදේශීය සභාව නැමති හොර ගුහාවෙ මම කතා කරන්නේ. තල්ගස්වල සති පොළ පිළිබඳව, මම පසුගිය වසරවලදී කතා කළා. කොයි වෙලාවේ විසුරුවයි ද දන්නෙ නැති නිසා පොළ ටෙන්ඩර් කරන්න කියලා. නමුත් පොළ කැඳවලා, ඉල්ලුම් කරපු ටෙන්ඩර්පත් එම වෙලාවේ සභාපතිතුමා හිටියේ නැහැ. උප සභාපතිතුමා තමයි මේක විවෘත කරල තියෙන්නෙ. ටෙන්ඩර් හයක් කඩලා, මේක අපට මේ සමාජයෙන් කියලා තියෙන්නේ. මේ ආයතනය ඇතුළේ පැය බාගයකට කල් තියලා, පැය භාගයකට පස්සෙ නැවත ටෙන්ඩර් ඉල්ලුම් කරපු කට්ටියත් එක්ක නැවත කැඳවලා, තව ටෙන්ඩර් දෙකක් එතනට ඇතුල් කළා. ටෙන්ඩර් අටක් ඇවිල්ලා තියෙනවා.

ටෙන්ඩර් මණ්ඩලයේ ඉන්න අපේ චන්ද්‍ර සහබන්දු හිටපු සභාපතිතුමා ප්‍රමාදවෙලා ඇවිල්ලා තියෙන්නෙ. මේ අතරතුරේ තමයි මේ දේ සිද්ද වෙලා තියෙන්නෙ. අපේ වැරැද්ද, වෙලාවට ටෙන්ඩර් කඩන වෙලාවේ හිටිය නම් හරි. මේ සභාවේ උඩුගම සතිපොළේ ටෙන්ඩර් එකටත් මෙහෙම කළා. අපේ හිටපු සභාපතිතුමා කතා කරලා, ඒ ගැන දැනුවත් කළා. මේ වගේ නොමනා වැඩ කරන තැනක් තමයි මෙතන. මේව කරපු නිලධාරීන් ඉන්නවා. නිලධාරීන්ගෙන් තමයි අපට තොරතුරු එන්නෙ. පස්සෙ බලනකොට වෙන කෙනෙකුට ටෙන්ඩරය ගිහිල්ලා තියෙනවා. මෙතන වෙච්ච වංචාව මීසක් පොළ ගත්ත කෙනා ගැන වැරදි කියන්නේ නැහැ. ඒක දැන් වෙනදාටත් වඩා හොඳට ක්‍රමවත්ව කරගෙන යනවා. හොඳ පරිපාලනයක් තියෙනවා. මම කියන්නේ මෙතන වෙච්ච වංචා සහගත වැඩේ ගැන. වැඩි ආදායමක් එනවා නම් කවුරු ගත්තත් අපට වැඩක් නැහැ.
දෙවැනි කාරණය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, නාගොඩ ගැන දැන් මේ කට්ටියම කතා කළා. පසුගිය කාලේ හොඳ හොඳ සෙල්ලම් මෙතන වෙලා තියෙනවා. දැන් මැතිවරණය තියෙන නිසා පසුගිය දේවල් එළියට එනවා. පසුගිය දවස්වල අපි මේ පළාත් වල ගෙවල් ලක්ෂ හය ගානේ දීලා හැදුවනේ කොට්ඨාසවල, ඒ හැම ගෙදරකින්ම ලක්ෂයකට එකහමාරකට වැඩි මුදලක් ගසා කාල තියෙනවා.

**ගරු සභාපතිතුමා පිළිතුරු දෙමින්**
ගරු මන්ත්‍රීතුමාගෙන් මම ඉල්ලීමක් කරනවා. මන්ත්‍රීවරුන් අපහසුතාවයට පත් කරනවා මේ ප්‍රකාශ වලින්. එවැනි ප්‍රකාශ කරන්න එපා කියල.

**ගරු මන්ත්‍රී වසන්ත කුමාරගේ මහතා**
ප්‍රාදේශීය ලේකම්තුමා හොඳ මනුෂ්‍යයකු නිසා ඒ ඒ වසම් භාර නිලධාරීන්ට තොරතුරු සොයාගෙන ඇවිල්ලා ඉදිරිපත් කරන්න කිව්වා. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට තොරතුරු ටික ගෙනල්ලා ප්‍රාදේශීය ලේකම්තුමා වැඩිපුර සොයා බලන්න හදනකොට කට්ටිය බය වුනා.සමහර අහිංසක මිනිස්සුන්ට සිදු වූ අසාධාරණය සම්බන්ධව ඔවුන්ගේ පැමිණිලි ඉදිරිපත් වෙලත් නැහැ. අහිංසක දරු පවුල් වලට ගෙවල් හදන එක හොඳයි. ඒක තමයි වෙන්න ඕන. රටේ ඉන්න, මෙතන ඉන්න මන්ත්‍රීවරුන්ට කර අරින්න බැහැ. මම ඔබතුමන්ලා කාටවත් ඇඟිල්ල දික් කරන්නේ නැහැ. හැබැයි මේ වගේ වගකීමක් ඇති දෙයක් වෙනකොට ඔබතුමන්ලා, ඔබතුමියන්ලා වගකියන්න ඕන. මම හෙට ඉඳන් මේ සියල්ල දැනුවත් කරන්න පටන් ගන්නවා.
ඊලගට අපේ ගරු සභාපතිතුමා කතා කළා, නාගොඩ සහා බල ප්‍රදේශයේ ආරම්භ කරන මත්පැන් වෙළඳසැල දානවද, නැද්ද කියන එක තියෙන්නෙ ඔබතුමාගේ අතේ.

එමෙන්ම මේ සභාපතිතුමා භාවිතා කරන කැබ් එක PF 7360, 252-6478 මේ දෙක තමයි මේ සභාවෙ විශාල මුදලක් කාබාසිනියා කරන කැබ් දෙක. මම බැලුවා මෙතුමාගේ කැබ් එකට ඩීසල් ගහලා තියෙනවා. මේ මාසෙට 237,000.00ක. මේ මහජනතාවගේ අහිංසක මුදල්. මිනිස්සු 1000.00,500.00 දීලා, වෙළඳ බලපත්‍රයක් කඩලා දීලා, හම්බවෙන මුදල්. මේවා පාලනයක් කරන්න පුළුවන්නෙ. මේ සභාපතිතුමාගේ කැබ් එක, මේවායින් මේ සභාවේ වැඩවලට දුවන්නෙ නැහැනේ. මළ ගෙදරක, මගුල් ගෙදරක, රැස්වීමකට මේවටනෙ දුවන්නෙ. ඇත්තටම ලැජ්ජයි සභාපතිතුමා, අහිංසක මිනිස්සුන්ගෙන් මුදල් කාබාසිනියා කරන්න එපා සභාපතිතුමනි,
මම එදා කිව්වා ඔබතුමාලට තුන්ලක්ෂ අසූ පන්දහසකට මාපලගම ලාල් මෝටර්ස් එකෙන් ඇස්තමේන්තුව දීලා තියෙන්නේ. ලක්ෂ හතයි ගානකට වඳුරඹ ගැරිජ් එකකට රෙපෙයාර් කරන්න දුන්නා. දැන් කියන්න ඒක බොරුනම් මම ලාල් මෝටර්ස් එකේ අධිපතිතුමාගෙන් අහලා ඔප්පු කරල පෙන්නන්නම්. දැන් කියන්න.

**ගරු සභාපතිතුමා අදහස් දක්වමින්,**
හරි මම ඒ සම්බන්ධව පරීක්ෂණයක් කරන්නම්.

**ගරු මන්ත්‍රී වසන්ත කුමාරගේ මහතා**
මේ සභාව මොනවද මේ මිනිස්සුන්ට කරල තියෙන්නේ? අද පයින්වත් යන්න බැරි ප්‍රාදේශීය සභා පාරවල් තියෙනවා. අර කොස් ගහ පාරේ බෝක්කුවක් සම්බන්ධව මම දිගින් දිගටම කතා කළා.

තුන්දෙනෙක් හතරදෙනෙක් වැටිලා මරණාසන්න වෙලා තිබුණා. නමුත් ඇයි බෝක්කුවක් හරි කොරි පස් ටිකක් හරි දාන්න පුළුවන්. ඔබතුමා තමන්ගේ බල ප්‍රදේශයට කරපු දෙයක් නැහැ. මම හෙට අනිද්දා වෙනකොට වමාරන්න පටන් ගන්නවා. මේ වකවානුවේ තුන් වේලෙන් එක වේලක්වත් කන්න බැරි විදිහට අපේ ගම් ප්‍රදේශයේ මිනිස්සු අන්ත අසරණ වෙලා තියෙන්නේ. හැබැයි මම හිතන්නේ ඔබතුමා නැවත සභාපතිකම් ගන්න බලන් ඉන්නවනම් ඒක හීනයක් තමයි. බොහොම ස්තූතියි.

**ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතා**
ගරු සභාපතිතුමා ප්‍රමුඛ සමස්ථ මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි. මම පළමුවෙන්ම ගරු මන්ත්‍රිනී ප්‍රියන්තා ගුණසේකර මහත්මියගේ පියාණන්ගේ අභාවය වෙනුවෙන් ශෝකය පළ කර සිටිනවා. ඒ වගේම කපල්විල ප්‍රජා ශාලාව පිළිසකර කර ගැනීම සම්බන්ධයෙන් පසුගිය සභා වාරයට මා විසින් යෝජනාවක් ඉදිරිපත් කර එය සභා සම්මත වුණා. එම කටයුතු කිරීම සම්බන්ධව අද දින ඇස්තමේන්තුවක් ඉදිරිපත් වෙලා තියෙනවා. ඒ සම්බන්ධව කටයුතු කරන ලද නිලධාරීන්ට මගේ ස්තූතිය පුද කර සිටිනවා.
ඒ වගේම අපේ සහෝදර වනමල් මන්ත්‍රීතුමාගේ කතාවෙදි කියවුනු පරිදි ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් ක්‍රියාත්මක වුන නිවාස ව්‍යාපෘතිය යටතේ මේ පළාත් වල කොට්ඨාසවල ලක්ෂ හය ගානේ දීලා ගෙවල් හැදුවා. ඒ හැම ගෙදරකින්ම ලක්ෂයකට එකහමාරකට වැඩි මුදලක් ගසා කාලා කියලා කියනවා. මම ඔබතුමාට කියනවා, එහෙම කරලා තියෙනවනම් ඔප්පු කරලා පෙන්වන්න කියලා. ඒ වගේම මෙම නිවාස ව්‍යාපෘතිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා තමයි සිදු වුනේ. ඒ වගේම දේශපාලනික වශයෙන් කිසිදු ඇඟිලි ගැසීමක් සිදු වුනේ නැහැ. ප්‍රාදේශිය ලේකම් කාර්යාලය හරහා අධීක්ෂණයෙන් තමයි සියල්ල සිදුවුනේ. ඔබතුමා වචන කතා කරද්දි ආවට ගියාට වචන ප්රකාශ කරන්නෙ නැතිව නිවැරදි තොරතුරු සොයා බලලා කතා කරන්න කියලා ඉල්ලා සිටිමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

**ගරු උප සභාපති එම්.කේ. ගාමිණි සුසන්ත මහතා**
ගරු සභාපතිතුමනි, වේලාසනින් මේ සභාවෙන් නික්ම යන්න මම අවසර පතනවා. උඩලමත්ත ප්‍රදේශයේ මලගමකට සම්බන්ධ වෙන්න කියලා ආරාධනා කළා. එම නිසා ප.ව. 2.00 ට පමණ විසිර යන්න අවසර ඉල්ලනවා. මම විශේෂයෙන්ම ප්‍රකාශ කරන්න කැමතියි. අපේ වනමල් මන්ත්‍රීතුමා කරන චෝදනා ප්‍රකාශ සම්බන්ධයෙන් මම දන්නෙ නැහැ, මෙතුමා ගමේ කොහොම ජීවත් වෙනවද කියලා. මෙතුමා මේ කරපු චෝදනා ප්‍රකාශ පිළිබඳව ඇත්තටම කණගාටු වෙනවා. මෙතුමා මේව අවබෝධයෙන්ද කරන්නේ කියලා. ප්‍රශ්නයක් තිබ්බ හෝ නොතිබ්බා සැරින් සැරේ නැගිටලා මේ සභාවේ ඉන්න නිලධාරීන් කිව්වා කියලා යම් ප්‍රකාශ කරනවා. එතුමා ඊට එහා දෙයක් කියන්න යන්නෙත් නැහැ. දැන් මේ ටෙන්ඩර් මණ්ඩලයේ මූලසුන සභාපතිතුමාගෙන් ලිඛිතව මට හිමි වුණා. එතුමා යම් කටයුත්තකට සම්බන්ධ වෙලා තිබුන නිසා, ලිඛිතව ලිපියක් සකස් කරල දීලා ගිහිල්ලා තිබුණා. ඒ නිසා නිල බලයෙන් මම එහි මුලසුන ගත්තා. මුලසුන ගෙන පෙ.ව.11.05ට මම මෙතනට ඇතුළු වූ විට අපේ සභාවේ නිලධාරීන්, හා සභාවේ සාමාජික ටෙන්ඩර් මණ්ඩලය ඇතුල් වුණා. 11.05ට මෙතන ගණපූර්ණය තිබුණෙ නැහැ. මට සිදුවුණා මූලාසනය මෙහෙයවන්නා වශයෙන් විකල්පය ලෙස මේක කල් තබන්න හෝ වෙනත් දිනයකට යොදාගන්න බැලුවම, පෙබරවාරි මාසය ලන් වෙලා තිබුන නිසා, කල්තැබීමට වෙලාවක් නොතිබුණු නිසාත්, කල් දැමීම නම් වෙනත් දිනයකදී සහභාගි වෙන්නත් ඕන. ඒ නිසා විකල්පය ලෙස විනාඩි 20කට කල් තබන්න අපේ ලක්රුවන් මන්ත්‍රීතුමා යෝජනාවක් කළා. ඒක ස්ථිර වුණා. එම නිසා පෙ.ව. 11:30 වෙන්න කලින් මේ සභාවට ඇතුළු වෙලා ටෙන්ඩර් මණ්ඩලයේ ගණපූරණය සම්පූර්ණ වී තිබූ නිසා, අපි සහබන්දු මන්ත්‍රීතුමාටත් දුරකථන ඇමතුමක් දුන්නා. එතුමා බද්දේගම උසාවියෙ නඩුවකට ගිහිල්ලා හිටියේ. ටෙන්ඩර් මණ්ඩලය අවසාන වෙන්න මොහොතකට කලින් එතුමත් සම්බන්ධ වුණා. ආපු මහත්වරුන්ට සියලු කාරණා පැහැදිලි කරලා දුන්නා. ටෙන්ඩර් දාපු මහත්වරු නෙවෙයි, එයාගේ අනුගාමිකයන් සහ වෙනත් කෙනෙක් සම්බන්ධ වෙන්නේ. ඒ ගැනත් මම පසු විපරම් කලා. එවිට කිව්වේ දාපු අය පැමිණිලා නැත්තේ, එයාලගේ අවසරය අරගෙන තමයි අනෙක් අය ඇවිල්ලා ඉන්නේ කියලා. ගිය පාරත් අනවශ්‍ය අය සම්බන්ධ වෙලා හිටපු නිසා තමයි මෙතන වෙන සිදුවීම් පිටතට ගියේ. අනවශ්‍ය කෙනෙක් සම්බන්ධ වෙලා ඉන්නවනම්, අපිට එළියට දාන්න බලයක් තියෙනවා නීත්‍යානුකූලව. මෙතනට ඇවිල්ලා ඉන්න අය මේ ටෙන්ඩර් පෙට්ටිය විවෘත කළා. නීත්‍යානුකූල නොවන ටෙන්ඩර් දෙකක් මෙතනට ආවෙ නැහැ. සියල්ල සිදුවුණේ නීත්‍යානුකූලව.

**ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා**
එකම හොරා වුණත් දෙතුන් වරක් එක පිට එක හොරකම් කරන්න යන්නේ නැහැ.

**ගරු උප සභාපතිතුමා**
මොන දේ කිව්වත් මේ නිලධාරීන් මෙතන රැකියාවක් කරන්නේ. රැකියාව ඉවර වුනහම හිස් අතින් මෙම නිලධාරීන් ගෙදර යන්නේ. වංචාවක් කරලා, තමන්ගේ දරු පවුල් රැකගෙන කොහොමද ජීවත් වෙන්නේ? ඒ නිසා මම හිතනවා කිසිම නිලධාරියෙක්, සමහර කිහිප දෙනෙක් ඇති. නමුත් කිසිම නිලධාරියෙක් තමන්ගේ රැකියාව නැති කරගන්න ඒ වගේ දූෂණයකට, වංචාවකට සම්බන්ධ වෙන්නේ නැහැ කියලා. මම විශේෂයෙන් පැහැදිලි කිරීමක් කරන්න කැමතියි. ටෙන්ඩර් පෙට්ටිය විවෘත කළා. ටෙන්ඩර් කීයක් තියෙනවද බැලුවා. ඊට පස්සේ ටෙන්ඩර් බෝඩ් එකෙන් නම් කියවලා බැලුවා. ඊට පස්සේ ඉන්නවද කියලා බැලුවා. ඊට පස්සේ අපි ඒවා ප්‍රකාශ කළා. ඒ නිසා එයාට දීලා සහබන්දු මහත්තයා නීත්‍යානුකූලව අත්සන් කරලා, අපි අවස්ථාවක් දුන්නා යමක් තියෙනවා නම් ප්‍රකාශ කරන්න කියලා. ටෙන්ඩර් පටිපාටියෙ අගති යමක් තියෙනවා නම්, කතා කරන්න කියලා සියලු දෙනාම එළියට ගියා. කිසියම් විරෝධතා නැහැ කියලා. නමුත් එතුමට කියලා තියෙන්නේ තල්ගස්වල පොල ගත්තු කෙනාම වෙන්න ඇති. එතුමා කියලා තියෙනවා වංචාවක් වුණා කියලා. මම දන්නෑ පුදුම සිද්ධියක් වෙන්නේ මෙතන. වනමල් මන්ත්‍රීතුමා මෙහෙම චෝදනා කරන කොට, ඔබතුමා ප්‍රසිද්ධ වෙන්න හෝ නැත්නම් ඔබතුමා ලකුණු දාගන්න හෝ කියනවා නම්, ඒක මම හිතන්නේ විශාල වැරැද්දක්. ඔබතුමා මේ ආයතනයට ඇවිල්ලා සභිකයෙක් වශයෙන් ගත්ත අනාගත බලාපොරොත්තුවක් තියෙනවනම් සභාපති වරයා වෙන්න, මම හිතන්නේ ඔබතුමාට ලොකු ප්‍රශ්නයක් වෙනවා. මොන කෙනෙක්ද මේ එන්නෙ කියලා. අපි කියනවා පරණතානායම්ගොඩ මිනිස්සුන්ට නිවැරදි පුද්ගලයො තෝරලා එවන්න කියලා මේ සභාවට. එච්චරයි කියන්න තියෙන්නේ.
වෙනත් දෙයක් සඳහන් කරන්නෙ නැහැ. අපි හිතනවා ලබන මාසේ ගරු සභාව තියයි කියලා. එහෙම නැති වුනත් ප්‍රශ්නයක් නැහැ. අපිත් කැමති නැහැ, මේක මේ වගේ කරගෙන යන්න. එම නිසා අපි මැතිවරණයකට සූදානම්. ඊළඟ සභාවේ බලය කවුරු ගත්තත් අපට ප්‍රශ්නයක් නැහැ. අපටත් පුළුවන්කමක් හෝ හැකියාවක් තිබෙනවා නම් ජනතාවගේ ඡන්දයෙන් අපි තේරී පත් වේවි. එහෙම නැතත් අපේ වැඩක් කරගෙන අපට ඉන්න පුළුවන්. ඒ පිළිබඳව සිහිපත් කරමින්, අපේ සුභාෂි මන්ත්‍රීතුමිය නිවාඩු අනුමත කරන්න කියලා ඉල්ලීමක් කරල තියෙනවා. එයත් මම මේ වෙලාවේ සිහිපත් කරනවා. සියලු දෙනාටම ස්තුතිවන්ත වෙමින්, මම නිහඬ වෙනවා. සියලු දෙනාටම සුභ අනාගතයක්.

**ගරු මන්ත්‍රී තරංග සුදර්ශන මහතා**
ගරු සභාපතිතුමා ඇතුළු සභාවෙන් අවසරයි. ගරු සභාපතිතුමනි, මම මුලින්ම ස්තුතිවන්ත වෙනවා, මීට මාස තුන හතරකට කලින් මුදල් කමිටුවේදී ප්‍රකාශයක් කළා. උඩුගම පොළෙහි සංවර්ධන කටයුත්තේ අඩුපාඩුවක් ගැන. ගරු සභාපතිතුමා, මම හිතන්නේ මුදල් ඇස්තමේන්තුවක් ඉදිරිපත් කරලා, ඒ වැරදි විදිහට කණු හිටවලා ඇත්ද යන්න සොයා බලලා, එය නිවැරදි කරන්න කටයුතු කරලා, ඒ බිල ගෙවලා තියෙනවා. ඒ සම්බන්ධව බොහොම ස්තූතියි. මොනවහරි කාරණාවක් කියන්න තියෙනවා නම්, ඇවිල්ලා හරි අත්සන් කරන්න කැමතියි කියලා මේ අවස්ථාවේදී ඒ ගැනත් සිහිපත් කරනවා. ඒ වගේම ස්තුතිය පුද කරනවා. ඒ වැරැද්ද නිවැරදි කරන්න හරි කටයුතු කිරීම පිළිබඳව.

ඒ වගේම සභාපතිතුමනි, අද වන විට පළාත් පාලනයෙන් තීරණයක් කැඳවලා, හැම කෙනාම මම හිතන්නේ තම තමන්ගේ පුද්ගලික තීරණය, ඊළඟ මැතිවරණයේදී තමන් මුහුණ දෙන ආකාරය පිළිබඳව සිතන කාල සීමාවක මම හිතන්නේ ඡන්දයට කටයුතු නොකරන, ඉදිරිපත් නොවන මන්ත්‍රීවරු කිහිප පොලක් ඉන්නවා. ඉතින් ඇත්තටම ඒගොල්ලන් යම් බලාපොරොත්තු තියාගෙන සභාවට ආවට, මේ සභාවෙන් ඒ අය ඉදිරි මැතිවරණයේදී ඉදිරිපත් වෙන්නේ නැහැ කියලා අපි දන්නවා. අපේ මන්ත්‍රීවරු නාගොඩ ප්‍රාදේශීය සභාවට තරඟ කරලා, ඔවුන් බලාපොරොත්තු වෙච්ච දේවල් කරන්න බැරි වෙන්නැති. ඔවුන් බලාපොරොත්තු නොවෙච්ච ආකාරයට, ඒ තීරණය වෙනස් කරන්න තීරණය කරලා ඉතින් කොහොමහරි සමහරු ඉන්නවා ලබන සභාපතිවරයෙක් පත් කරන විට ඒ සභාපති වීමේ හැඟීමෙන් කටයුතු කරන අවස්ථා අපි දැකලා තියෙනවා. එහෙම ප්‍රසිද්ධ වෙච්ච අවස්ථා තියෙනවා.

ඇත්තෙන්ම ගිය සැරේ මැතිවරණ මුහුණුවරත් එක්ක අපි කල්පනා කරලා බලන්න ඕන, පොහොට්ටුව ලකුණෙන් තරඟ කරපු සියලු දෙනා, කොට්ඨාස ජයග්‍රහණය කරලා මේ සභාවට පත් වුණා. අනෙක් කණ්ඩායම් වලින් පත්වෙච්ච අය ලයිස්තු වලින් තමයි සභාවට පත් වෙන්න හැදුවේ. කොහොම වුණත් සභාපතිතුමනි, ආණ්ඩු පක්ෂයෙන් 15 න් 15 පත්වෙච්ච අවස්ථාවේ, 15න් 12 දෙනෙක් හිටියා විපක්ෂයට. ඒ කොහොම වුනත් සහයෝගය දක්වන්නත් පුළුවන්, නොදක්වන්නත් පුළුවන්. විරුද්ධ වෙනවා නම්, විරුද්ධවෙලා සභාපති ධුරයත් වෙනස් කරන්න පුළුවන් වෙලාවක්. ඔබතුමාලා 15න් 15 ම දිනලා හිටපු වෙලාවේ ඉදිරියේදී නම් එහෙම බලාපොරොත්තු වෙන්න බැහැ. මොන පක්ෂයකටවත් සභාපති කෙනෙක් තනියම පත් කරන්න බැහැ. කවුරුහරි හිතනවනම්, ඒක ඒ ආකාරයෙන් සිද්ධ වෙන්නේ නැහැ. ඔය කණ්ඩායම් එකතු වුනහම නොහිතන ප්‍රතිඵලයක්, ඔය කණ්ඩායම් එකතු වුනහම සභාවෙ බලය රැකගන්න, මම හිතන්නේ නොහිතන ප්‍රතිඵලයක් ඉදිරියේදී අපට දැකගන්න පුළුවන්. ඒ සම්බන්ධව එක්තරා සිද්ධියක් තියෙනවා. යම්කිසි අවස්ථාවකදී ස්වාධීන කණ්ඩායම්වලටත් හැකියාව තියෙනවා ඉදිරිපත් වෙන්න. මම හිතනවා මාර්තු මාසෙදිවත් ඡන්දයක් තියයි කියලා. අනෙක මේ ක්‍රමය නිසා ලංකාවේ වෙනත් මැතිවරණ ක්‍රමයක් තියාවි කියලා මම හිතන්නේ නැහැ. මේ මැතිවරණ ක්‍රමය අයින් කරලා සභාවේ නව මැතිවරණ ක්‍රමයක් තමයි දක්නට ලැබෙන්නේ. අපි ඒකේ හිටියත්, නැතත්, ජාතික අපරාධයක් නොවෙන්න කටයුතු වග බලා ගන්න කියලා ඉල්ලනවා. 2011 සභාවට එනවිට අපි දහ තුන් දෙනයි හිටියේ. ඒකත් එක්කම, ඒ පරිසරයයි, අද පරිසරයයි බැලුවම අද පුදුමාකාර වෙනසක් තියෙනවා. ඒක මම දන්නෙ නැහැ. මේක ද ගැලපෙන්නෙ කියලා. මේ ගම් පළාත්වලට ඒ ක්‍රමය අහෝසි වෙලා කුඩා කණ්ඩායමක් දැකගන්න පුළුවන්. දක්ෂ සභාපතිවරයෙක් මේ නාගොඩ ප්‍රාදේශීය සභාවට පත් වෙලා එහෙම වෙයි කියලා අපි දැඩි ලෙස විශ්වාස කරනවා.
ඒ වගේම උඩුගම ක්‍රීඩාපිටිය, උඩුගම පිට්ටනිය මැදින් ගහපු ක්‍රීඩාපිටියේ වැට අයින් කරලා, එහි ක්‍රීඩාපිටියට විධිමත් පරිදි ඉඩ සලසා දෙන්න කියලා, මොකද ඒක නිරන්තරයෙන් ප්‍රයෝජනවත් වෙනවා. පසුගිය දවස්වලදී දිවා රාත්‍රී වොලිබෝල් මැච් එකක් තිබුණා. ඒකෙ හතර සීමාවට යන්න බැහැ. පිට්ටනියෙ මැදින් වැට ගහලා තියෙන්නෙ. හරි දේ කරන්න අපි කටයුතු කරන්න ඕන. කොමසාරිස් පාලනය තිබ්බෙච්ච වැරැද්දක්, එය නිවැරදි කරන්න කටයුතු කරන්න කියලා මේ අවස්ථාවේ දී නැවතත් ඉල්ලා සිටිනවා. ඒ වගේම සභාපතිතුමා, ඉන්ජෙක්ටර් පොම්පය පිළිබඳව එක දිගට කතා වුණා. ලක්ෂ හතක් වියදම් කරපු 252- 6478 කැබ් රථය ඒ කාලේ තියෙන අවශ්‍යතාවය මත තමයි, අපි වාහනයක් හදන්න ඇස්තමේන්තුවක් සභාවට දාන්නෙ. නමුත් අවශ්‍යතාවය මත ලක්ෂ හතක් දීලා, හදල නම් ඒ වාහනයේ සයිඩ් කන්නාඩි කැඩිලා, වයර් වලින් නම් එල්ලගෙන යන්නේ. ඊට පස්සේ යන යන තැන නවතිනවා නම්, තල්ලු කරලා, ස්ටාට් කරලාවත් යන්න බැරි තත්ත්වයක් තියෙනවා නම්, කවුද ඒ වාහනයේ අවශ්‍යතාවය හඳුනා ගත්තේ. කාගේ වුවමනාවටද ඒ රෙපෙයාර් එක වුනේ කියලා හිතන්න වෙනවා. විශේෂයෙන්ම අපේ ප්‍රදේශයෙන් පිට වඳුරඹ ග්‍රෑන්ඩ් මෝටර්ස් කියන ආයතනයේ රෙපෙයාර් ගැන නම්, ඒ ආයතනය පිළිබඳවත් මම විශ්වාස කරන්නෙ නැහැ. එක්තරා සමාගමක කටයුතු කරපු සේවකයෙක් හිතවත් සභාවල අවශ්‍යතාවලට අනුව කටයුතු  කරන්නේ හිතවත්කම් අනුව. මම දන්නවා සභාවේ එක්තරා වාහනයක ජියර් බොක්ස් එන්නෙ නැහැ. ඒ වාහනයටම  වෙනම ජියර් බොක්ස් එකක් ගෙනැල්ලා, කපලා හදලා, ඒක ධාවන තත්වයෙන් දුවනවා. මම හිතන්නේ එළවළු  ගේන්න ගිහිල්ලා, හයිවේ එකේදි ඇදගෙන ආපු වාහනය ඒ වගේ වැඩ කරලා හදන්න පුළුවන් දක්ෂ කාර්මික ශිල්පියො අපේ ප්‍රදේශයේ ඉන්නවා. එවැනි තැන්වලට නොදා, අපේ බල ප්‍රදේශයෙන් පිට ඒ වගේ ආයතනයකට දීම,  මම හිතන්නේ ලොකු බිල්  දාලා ලක්ෂ ගණන් වලින් බිල් ගෙවපු වාහන, තල්ලු කරන් යන තත්වයට පත්කරලා තියෙනවා. ඉදිරියේදී, මේ සභාව තව මාස කිහිපයක් හරි තියෙනවා නම්, එවැනි දේවල් මේ සභාවේ වෙන්න දෙන්න එපා කියලා මම ඉල්ලා සිටිනවා. 252-6478 කැබ් එක 2022.08.02 සම්පූර්ණ සේවාවක් කරනවා. අවුරුදු කිහිපයකින් සර්විස් කළේ නැහැ කියලා රුපියල් අටදහස්  ගාණක බිලක් දෙන විට, අපි ඇහුවා සර්විස් කරන්න මොකටද ඔච්චර බිලක් කියලා, ඒකෙදි ඔය කියන අඩුපාඩු ෆිල්ටර්  ආදිය දාලා තියෙනවා. 12.19 රුපියල් 90000.00 ක් වියදම් කරලා ඉන්ජෙක්ටර් ෆෙෂර් කරලා, අලුතෙන් නොසෙල් දාලා හදලා තියෙනවා. සාමාන්‍යයෙන් නම් ඉන්ජෙක්ටර් හදලා ෆිල්ටර් දාන්නෙ නැහැ. මේ බිල් ඉදිරිපත් කරන එකේ ගැටලුවක් මට පේන්නෙ. 12.19 තමයි බිල්වල නම් දාලා තියෙන්නේ. 90000.00 ක බිල ගෙවලා මාස දෙකකට පස්සේ තමයි අනෙක් බිල ඉදිරිපත් කරන්නේ.

**ගරු සභාපතිතුමා අදහස් දක්වමින්**
ඒක ගෙවන එක නතර කළේ මම. ඉංජිනේරු වාර්තාවක් අරගෙන එන්න කියලා.

**ගරු මන්ත්‍රී තරංග සුදර්ශන මහතා**
මේ බිල් දෙක දෙපාරකට ආපු එක තමයි ගැටලුව අපි දන්නවා ඉන්ජෙක්ටර් පොම්පය දානවනම් අනිවාර්යෙන් ෆිල්ටර් මාරු කරන බව. සාමාන්‍යයෙන් රෙපයාර් එකකට ඇස්තමේන්තුවක් ගන්නවා නම්, ඒ දෙකම එකට යන නිසා ඒ දෙක අදාලයි. 99000.00 ක් කියලා දුන්න නම්, මෙතරම් ගැටලුවක් වෙන්නේ නැහැ. ගොඩක් වෙලා කතා කලා ඉදිරි ගෙවීම් වලදී, ඒ මේ බිල් දෙක වෙන වෙනම ආපු නිසා. එහෙම වෙනවා නම් යම් දැනුමක් තියෙනවානේ. මේ විසිහත් දෙනා මෙතෙක් ඉතිහාසයේ වෙලා නැති මිල ගණන් කැඳවීම, කමිටුවකින් සම්මත කර නොගෙන, මේ හැමෝම ඉස්සරහ කඩන්න ගත්තා. එතකොට 27 දෙනෙක් පැය එකක් ඔය වෙනුවෙන් කැප කළොත්, පැය විසි හතක්. ඒ වගේම ඔබතුමාම කියනවා, නැගෙනහිර පළාතෙ ඉරක්කාමම් කියලා සභාවක් නරඹන්න ගියා. ඒක පැය භාගයකින් සභාව අවසන් කරනවා කියලා. නමුත් අපිත් ලොකු වෙලාවක් ගන්නේ නැතුව, සභාවට අත්‍යවශ්‍ය දේ විතරක්, තීරණ ලබාගත යුතු දේ විතරක් අරගෙන, සභාව කරනවා නම්, ලේකම්තුමිය හරි වටිනවා. අපරාධයක් මේ කාලය වැය කිරීම. මේ ප්‍රසම්පාදන මිළ ගණන් ටික මහා සභාවෙදි විවෘත කිරීමෙන් අපට පෙනී යන්නේ අපි අන්තිම සභා වාරයේදී හෝ විනිවිදභාවයෙන් වැඩ කළා කියලා. නමුත් මේ සභා ඉතිහාසයේ මෙහෙම වුණේ නැහැ. මෙතන ලියුම් කවර කැඩුවට අපි පිළිගන්න ලෑස්ති නැහැ. මේවා තැපැලෙ ආවා කියලා. ලියුම් කවරෙ වර්ණය එක වගේ නිසා එහෙන් මෙහෙන් ගෙනැල්ලා මෙතන අලවලා වෙන්නත් පුළුවන්. අපි එහෙම දේවල් දැකලා තියෙනවා. සාමාන්‍යයෙන් මේ සභාවේ එහෙම වෙන්නේ නැති කියලා අපි විශ්වාස කරනවා. හිතට එකඟව කවුරු කළත්, ඒක කරාද නැද්ද කියන එක නෙවෙයි, ඒ සැක සහිත දේ නිවැරදියි, වැරදියි කියලා දකින්න මට හැකියාවක් තියෙනවා. අද විතරක් මෙහෙම සිදුවීම් අසාමාන්‍ය දෙයක්. ඉතින් ගරු සභාපතිතුමනි මීට වැඩිය ඒ සම්බන්ධව කතා කරන්න මම ලෑස්ති නැහැ. ඉදිරියේදී සභාව තිබුනත් මීට වඩා කෙටි කාලයකින් සභාව අවසන් කිරීමට හැකිවේවා කියා ප්‍රකාශ කරනවා. 2018 පත්වෙච්ච ඇතැම් මන්ත්‍රීවරුන්, මේ මැතිවරණයේදී තරග කරන්න ඉදිරිපත් වෙමින් ඉන්නවා. ඒ අය බලාපොරොත්තු වෙන ආකාරයට මේ සභාව නියෝජනය කරන්න ලැබෙන්න පුලුවන් වේවා කියා ප්‍රාර්ථනා කරමින්, මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

**ගරු මන්ත්‍රී අමර ධනංජය විලේගේ මහතා**
සමස්ත සභාවෙන් අවසරයි. මීට මාස ගානකට කලින් කිව්ව වගේ අවසන් සභාවාරය කියලා හිතාගෙන මම කතා කරනවා. උඩුගම කොටස ගත්තම, උඩුගම කොටසේ පත්ව සිටින මන්ත්‍රීවරුගෙන් ඊළග මැතිවරණයට ඉදිරිපත් නොවන එකම අපේක්ෂකයා මම. එම මන්ත්‍රීවරයා විදිහට මට වචනයක් කතා කරන්න ඕන. මම හිතන්නේ මේ මැතිවරණ ක්‍රමය ගත්තම, මම මේ මැතිවරණ ක්‍රමය යටතේ තරඟ වදින්නේ නැහැ කියලා හිතා ගත්තේ මේ ප්‍රාදේශීය සභාවට ඇවිල්ල පළවෙනි අවුරුද්දේදී. මොකද දැන් මේ රටේ තිබෙන ආර්ථික තත්වයත් එක්ක හැමෝම මැතිවරණයක් ඉල්ලනවා. නමුත් රටේ ආර්ථික තත්වයත් එක්ක ප්‍රාදේශීය සභා මැතිවරණයේදී අපි හැමෝම දැනගන්න ඕන. ජනාධිපතිවරයාවත්, කැබිනට් මණ්ඩලයවත් වෙනස් වෙන්නේ නැහැ. එතකොට මේ ආර්ථික අර්බුදයක් තියෙන වෙලාවේ මේ කියන මැතිවරණයට මම දැඩි සේ විරුද්ධ වෙනවා. මම හිතන්නේ ඒක වාර්තාගත වේවි. ඒක තමයි මම මැතිවරණයට ඉදිරිපත් නොවීමට මූලිකම කාරණය. ඒ වගේම ලංකාවේ 8700 ක්ම පළාත් සභා මන්ත්‍රීවරු ඉන්නවා. සමහරු හිතනවා මේ මැතිවරණයට යන වියදම විතරයි යන්නේ කියලා. නෑ සභාපතිතුමනි, අපි මේ අවුරුදු පහට රුපියල් 19000.00 ගානේ ලක්ෂ 11 ට ආසන්න මුදලක් ලක්ෂ 11 ½ ඒවා අවුරුදු 5කට වෙන් කරලා තියෙන්නේ. මේ මැතිවරණය හරහා එතකොට ගණන් හදලා බලන්න ඕන. ලක්ෂ 11 ගානේ 8700ට වෙන්වෙන මුදල, 225 එපා කියපු 8700 පත් කරගන්න මහ පාරට බහින්න සූදානම් වෙලා ඉන්නවා. මෙන්න මේක තමයි මගේ පළවෙනිම කාරණය. ඊළඟ කාරණය මගේ ප්‍රතිපත්තිමය කාරණයක්. විපක්ෂයේ මන්ත්‍රීවරු, පොහොට්ටුවේ මන්ත්‍රීවරු සමාවෙන්න ඕන, මම මේ කියන කාරණයට. මාත් එක්ක තර්ක කරන එකක් නැහැ. මගේ ප්‍රතිපත්තිමය කාරණයක්. රනිල් වික්‍රමසිංහ කියන නායකයා මම දකින්නේ, මේ රටේ හැටනම ලක්ෂයක් ප්‍රතික්ෂේප කරපු නායකයෙක්. එක්සත් ජාතික පක්ෂයේ 90% ප්‍රතික්ෂේප කරපු නායකයෙක්. ඊළඟට මම දකිනවා පොදුජන පෙරමුණ නියෝජනය කරමින්, හරි ඊලග නායකත්වයට පත් වෙන්න ඉන්නවා. මේ වගේ ජනතාව ප්‍රතික්ෂේප කරපු නායකයෙක් බලයට ගෙන ඒමට දායක වීම මම ප්‍රතිපත්තිමය වශයෙන් කැමති නැහැ. ඒක මගේ පුද්ගලික මතයක්. මට දායකත්වය ලබා දීමට බැරි මගේ දෙවැනි කාරණය විදිහට මගේ මැතිවරණයට ඉදිරිපත් නොවීමට කටයුතු කරනවා. තෙවැනි කාරණය මගේ පුද්ගලික

කාරණයක්. ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් වන වෙලාවේ තමයි මම උපාධි අපේක්ෂකයකු වශයෙන් හිටියේ. නමුත් මැතිවරණයට ඉදිරිපත් වීම නිසා ඒ කටයුතු මඟ ඇරුනා. දැන් ඒ අවස්ථාව මට කොළඹ විශ්වවිද්‍යාලයෙන් ලැබිලා තියෙනවා. ඒ සඳහා සහභාගි වෙන්න ඕන. මෙන්න මේ කාරණා තුන හේතුකොටගෙන මැතිවරණයට ඉදිරිපත් නොවීමට මම තීරණය කළා. පළාත් පාලන මැතිවරණ විකෘතියේ ගොදුරක් වීමට මම කැමති නැහැ. මේ වන විට සමාජයේ තිබෙන්නේ විකෘති මතයක්. වැඩ නොකර විවේචනය කර කර ඉන්න කෙනාට ඉන්න පුළුවන්. නමුත් ඕනම පක්ෂයකට පොදු කාරණයක් වැඩ කළොත් තමයි දෝෂාරෝපණ වුනත් එන්නේ. සමීක්ෂණ වාර්තා අනුවත් 60%ක් තීරණය කරලා නැහැ තාමත් ඡන්දය දෙන්නෙ කාටද කියලා. කොළඹ විශ්වවිද්‍යාලය දැනට කරලා තියෙන සමීක්ෂණ වාර්තා අනුව ඡන්දය පැවැත්වුණත්, නැතත්, ඉදිරි මැතිවරණයට ඉදිරිපත් වන සියලු දෙනාට මගේ සුභාශිංෂණ ඉදිරිපත් කරමින්, ගමට රටට වැඩක් කරන්න පුළුවන් නව ප්‍රාදේශීය සභාවක් බිහි වේවා කියලා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා.

**ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා**

සමස්ත සභාවෙන් අවසරයි. මම ප්‍රථමයෙන්ම ගරු ප්‍රියන්තා මන්ත්‍රී තුමියගේ පියාණන්ගේ අවමංගල්‍ය උත්සවයට සම්බන්ධ වෙන්න වුණේ නැහැ. ඇත්තටම මම දන්නේ නැහැ. දැනුවත්වීම ලැබුණේ නැහැ. මාගේ සංවේගය එතුමියට මේ අවස්ථාවේදී පුද කර සිටිනවා. ඒ වගේම තමයි අපේ ලේකම්තුමියට ස්තුතිවන්ත වෙන්න ඕන. ජාතික ජන බලවේගය හැටියට මාපලගම මහජන ක්‍රීඩාංගනයට ගියහම ග්‍රවුන්ඩ් එක දිහා බැලුවම මොකක්ද කියලා හිතුනා. ලේකම්තුමිය දැනුවත් කළාම, එතුමිය වහාම එය සුද්ද පවිත්‍ර කරවල දුන්නා. එතුමියටත්, ගරු සභාපතිතුමාටත් මේ අවස්ථාවේ ගෞරවය පුද කරනවා.

ඒ වගේම කතා කරන්න බොහෝ දේවල් තියෙනවා. නමුත් මේ අවස්ථාවේ අපි නිලධාරීන් අපහසුතාවයට පත් කරන්න කැමති නැහැ. සභාව දිහා බැලුවම කියන්න දේවල් තියෙනවා. අපි අවුරුදු හතර පහක් හිටියත් අපට කරපු දෙයක් නැහැ. ඊයේ පොළේදී වුණත් වනමල් මන්ත්‍රීතුමා කිව්ව පරිදි මටත් කට්ටිය පොළේදී මේ ටෙන්ඩර් සම්බන්ධව මෙහෙම මෙහෙම වුණා කිව්වා. නමුත් දැන් ඔක්කොම පරික්ෂා කරල බැලුවම, නිවැරදිව සෑම දෙයක්ම සිදුවෙලා තියෙනවානේ. ඒ නිසා ඒ සම්බන්ධව මම කතා කරන්න යන්නෙ නැහැ. අපේ ගනේවත්ත මන්ත්‍රීතුමා සාක්ෂි දරනවා. අපි නිස්සරණ සේවාවක් කරන්නේ. මගේ පඩිය යන්නේ අපේ පක්ෂයේ අරමුදලට. පසුගිය දිනවල ලක්ෂ විස්සක් අපේ අරමුදලෙන් උඩවැලිවිටිතලාවේ ඉස්කෝලේ ග්‍රවුන්ඩ් එක හදන්න ලබා දුන්නා.

ඒ වගේම මම ඉල්ලා සිටිනවා වාහන බිල් සම්බන්ධව පරීක්ෂණයක් කරන්න කියලා. මේ මාසේ වත් විසුරුවයි. ඒ වගේම වංචාවෙන් තොර රටක් ගෙන යාමට සියලු දෙනාට ශක්තිය, ධෛර්ය ලැබේවායි ප්‍රාර්ථනා කරමින්, මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

**ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා**

ගරු සභාපතිතුමනි, මම හිතන්නේ මේ වෙලාවේ කාලවේලාව ඉක්මවා ගියත්, කතා කරන්න නොහිටියත්, මන්ත්‍රීවරුන් කිහිප දෙනෙක් කියන අදහස්වලට පිළිතුරු ලබාදීමට තිබෙනවා. මම විශ්වාස කරනවා විශේෂයෙන්ම අපේ ජයවීර මන්ත්‍රීතුමා සඳහන් කර සිටියා, අපේ කොට්ඨාසෙ උඩවැලිවිටිය මහා විද්‍යාලයට ලක්ෂ 20ක මුදලක් ලබා දුන්නා කියලා. නමුත් ඒක පළාත් සභාවෙන් තමයි පක්ෂ, විපක්ෂ හැම මන්ත්‍රී කෙනෙකුටම එක ළඟ තියෙන විද්‍යාල දෙකක් කරගන්න කියලා. ලක්ෂ 10 ගානේ හැම මන්ත්‍රීවරයෙකුටම දුන්නා. ඔබතුමාලටත් ඒ ලක්ෂ 10 ලැබුනට පස්සේ ඒක උඩවැලිවිටිතලාව මහා විද්‍යාලයට නැත්නම් ඒක පක්ෂ අරමුදලෙන් නොවෙයි. ඒක හම්බ වෙන්නේ. ඒක මම හොඳටම දන්නවා. ඒ නිසා මම මේ වෙලාවේ දැඩිව කියා සිටිනවා, මෙවැනි ප්‍රකාශ සමාජගත කරන්න එපා කියලා.

ඒ වගේම තමයි ඉතාම කෙටියෙන් කතා කරනවා, මම ටෙන්ඩර් ප්‍රශ්නය සම්බන්ධව වගකීමෙන් ප්‍රකාශ කරනවා ටෙන්ඩර් මණ්ඩලයෙ මම හිටියා. එතැන ටෙන්ඩර් හතරයි ආවේ. ඒත් 4න් දෙකක් තල්ගස්වල, දෙකක් උඩුගම. කිසිම වංචාවක්වත් මෙතන සිද්ධ වුණේ නැහැ. නිලධාරීන්වත්, මෙතන ඒ අයගේ ඥාතීන්වත් එහෙම එකක් නෙවෙයි. හරියටම නීතිරීතිවලට අනුකූලවම ඒ වැඩේ සිද්ධ වුණා. ඒ සිද්ධ වීම තුළ පොළේ යම් පරිවර්තනයක් එතන දැන් සිද්ධ වෙනවා. ඒක බලාගෙන ඉන්න බැරි කණ්ඩායමක්. දැන් මෙතන ඇවිල්ලා අපේ මන්ත්‍රීවරු මෙතන අපහසුතාවයට පත් කරනවා. මම පෞද්ගලිකවම මේ අවස්ථාවේදී වනමල් මන්ත්‍රීතුමාගෙන් ඉල්ලා සිටිනවා, මේ වගේ බරපතළ ප්‍රකාශ

කරන්න ඉස්සෙල්ලා, වෙලාවක ඇවිල්ලා සභාවේ මේ නිලධාරීන්ගෙන් නිවැරදි තොරතුරු අරගෙන කතා කරන්න පුළුවන්කම තියෙනවා. ඒ වගේම ජයවීර මන්ත්‍රීතුමා කිව්වා වගේ, මමත් මේ ටෙන්ඩර් මණ්ඩලයේ ඉන්නවා. කොයිම අවස්ථාවකදීවත් මෙහෙම වංචාසහගත දේවල් එහෙම සිදු වෙන්නේ නැහැ අපෙන්. අපි හරියට ඒ දේ කරනවා. නැත්නම් නිකන් ඉන්නවා. ඒ නිසා මම හිතන්නෙ, මට කිසිම වරප්‍රසාදයක් ඇත්තෙ නැහැ. මට පුළුවන් හැම වෙලාවකම හදිස්සියේ හරි සහභාගී වෙනවා. මම උත්සාහ ගන්නවා විනිවිදභාවයෙන් මේ වැඩේ කරන්න. ඒක ගැන තර්කයක් නැහැ. ඒ කටයුත්තේදී ඔබතුමාගේ ප්‍රකාශය නම් ඇත්තටම බරපතළ ප්‍රකාශයක්.
මම දීර්ඝ වශයෙන් සාකච්ඡා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. කොහොම වුණත් ඉදිරියේදී පැවැත්වෙන මැතිවරණය සමහර අය 90%ක් ඉවර කරලා තියෙනවා. අපි තවම මැතිවරණයට අවතීර්ණ වුණේ නැහැ. තවම ඒ සම්බන්ධව කටයුතු කලෙත් නැහැ. දැනට කණ්ඩායම් ජයග්‍රහණය කරලා තියෙනවා. අපේ මිනිස්සු ටික තාම නිහඬව බලාගෙන ඉන්නවා. මොන දේ කරත් ඊළඟ මැතිවරණයේදී කවුරු මොනවා කිව්වත්, ප්‍රතිඵලය බලාගන්න පුළුවන්. මම හිතන්නේ ප්‍රාදේශීය සභා වැඩ පිළිබඳව අපේ මන්ත්‍රීවරුන්ට යෝජනා කරන්නේ. තමන්ට අයිතියක් තියෙනවා කතාබහ කරන්න. නිවැරදි තොරතුරු ඉදිරිපත් කරන්න කියලා ඉල්ලා සිටිනවා. ඒ වගේම මම හිතන්නේ නිවාස සම්බන්ධයෙන් කතා කළා. මමත් අපේ කොට්ඨාශයේ මිනිස්සුන්ට ලබා දුන්නා, ග්‍රාම නිලධාරී, සෞඛ්‍ය නිලධාරී, කෘෂිකර්ම පර්යේෂන නිලධාරී, ග්‍රාමීය කමිටුවකින් තමයි තෝරගන්නෙ මොනයම් වෙලාවකවත් මුදල් ගනුදෙනු කරන්න ගියේ නැහැ. ඒකෙ චෙක් එකක් දුන්නම තමයි ගනුදෙනු කළේ. අපි මන්ත්‍රීවරු හැටියට කොයි වෙලාවකවත් අපි සම්බන්ධ වෙලා ගනුදෙනු කරන්න ගියේ නැහැ. විනිවිදභාවයෙන් ඒ කටයුතු සිදුවුණාද, නැද්ද කියන එක මම හිතන්නේ දේශපාලන අධිකාරියේ හැටියට අපි නිවැරදි තෝරා ගැනීම කරන්න වුවත්, අපට අවශ්‍ය දේවල් තෝරගන්න අපට අවස්ථාව ලැබුණේ නැහැ. මම හිතන්නේ ඒ චෝදනාවත් බැහැර කරමින්, මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

**ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා**
ගරු සභාපතිතුමනි, මම වැඩි වෙලාවක් ගන්නේ නැහැ. මේ වෙලාවේ දීර්ඝ වශයෙන් කතා කළා. කොහොම වුණත් මේක අවසන් සභාවාරයද දන්නෙ නැහැ. කොහොම වුණත් අපේ අදහස තියෙන්නේ, පාන් කියාගන්න බැරි වෙලාවේම මැතිවරණය ඉල්ලන වෙලාවක් මේක මේ කට්ටිය ඇත්තටම රටට, ජාතියට ආදරේකට නෙවෙයි මේ වෙලාවේ ඡන්දය ඉල්ලන්නේ. තමන්ගේ රැකීමට, ඔයාලා කිව්වා, පක්ෂෙ සටන් බිමට අපි ආවෙ නැත්නම් කියලා, යූඇන්පීකාරයෝ පැනලා ගියා කියලා, එහෙම යන ජාතියක් නෙවෙයි යූ.ඇන්.පී කාරයෝ. ඉතින් ඒක නිසා අර පැත්තෙන් ජනතා විමුක්ති පෙරමුණ එදා එයාලා කිව්ව මැතිවරණය අවශ්‍ය නැහැ කියලා. තමුන්නාන්සේලාගේ නායකයාට, අද දෙන්නටම ඔළුවෙ අමාරුව හැදිලා, මැතිවරණයට කතා කරනවා. කොහොම වුනත් මැතිවරණයට යන සල්ලි වලින් මම යෝජනා කරනවා, අර නාගොඩ විද්‍යාලයේ එහෙම නැත්නම් මේ සියලු විද්‍යාලවල අහිංසක දූවා දරුවන්ට පොත් පත් ටික අරන් දෙන්න කියලා, ඒක තමයි මම හිතන්නේ වගකීම. ඒ වගේම මෙතන කතා වුණා, පොළ සම්බන්ධව, ඒකේ වරද මම හිතන්නේ මෙතුමා වැරැද්දක් කළා නම්, මෙතන හිටපු නිසා මම දන්නවා, නැවතත් ඔය කියන ටෙන්ඩර් ඕපන් එකේදී ඔය වරද සිදුවුණේ නැතෙයි කියලා. අනිත් එක තමයි මීට පෙරත් ටෙන්ඩර් එකකදි මේ නිලධාරීන් අතින් ප්‍රශ්නයක් වුණා. ඒ නිසා එක ළඟ දෙවරක්, එකම වරද කරන්න හිතයි කියලා මම හිතන්නේ නැහැ. ඒ නිසා ඒක මම ප්‍රතික්ෂේප කරනවා. වනමල් මන්ත්‍රීතුමා ටෙන්ඩර් සම්බන්ධව කළ චෝදනාව, ඒ වෙලාවේ ඇත්තටම ඒ ටෙන්ඩර්කරුවන්ට කිව්වා ප්‍රකාශ කරන්න යමක් තියෙනවා නම් ප්‍රකාශ කරන්න කියලා. නමුත් මොනම දෙයක්වත් ප්‍රකාශ කළේ නැහැ. මම ඇහුවා, මම ප්‍රමාද වෙලා ආපු නිසා සාධාරණවද මේ සිද්ධිය වුනේ කියලා. එතකොට කිව්වා ඔව් කියලා. එවිට තමයි මම අත්සන් කළේ. ටෙන්ඩර් විවෘත කරන වෙලාවෙ මම හිටියෙ නැහැ. ඊට පස්සේ මම ආවේ. මට ඕන වුනේ සාධාරණත්වය ගැන කතා කරන්න, මේකට අදහසක් දැක්වුවේ නැත්නම්, ටෙන්ඩර් මණ්ඩලයේ වැරැද්ද විතරක් පෙන්නන්න නැහැ, හරි දේත් පෙන්නන්න ඕන, මීට වඩා පොළ සම්බන්ධව මම කතා කරන්න යන්නෙ නැහැ.
සභාපතිතුමා අද හැසිරුණු ආකාරයට 2018 මෙම සභාව පටන් ගන්න කොට, පටන් ගෙන මාස තුනක්වත් ගිහිල්ලා මේ විදියට හැසිරුණා නම් හොඳ දේවලුත් ගන්න තිබුණා. පුංචි ළමයෙකුට වුණත් පේනවා එකම කඩේ ලියුම් කවර මිටිය, ටෙන්ඩර් මිළ ගණන් විවෘත කිරීමේදී මම ලියපු හැටිත් බැලුවා. එකම අකුරු, එකම මිටිය එකට ලියලා, මම නිර්දෝෂයි කියන්න වගේ සභාව ඉදිරියට ගෙනල්ලා අවුරුදු 5කට පස්සේ මේක විවෘත කරනවා. පැය දෙකක් මේකට ගියා. කිසිම හේතුවක් නැතුව,

අඩුගානෙ තුන්හතර දෙනෙක් වාඩි වෙලා තමුන්නාන්සේලාගේ කවුරුහරි මන්ත්‍රීවරු දෙතුන් දෙනෙක් ගෙන්වලා, මේ වැඩේ කලා නම් හරි.
මෙතන ලොකු දක්ෂ සිද්ධියක් වෙච්ච නිසා තමයි, ඔය දැන් දිගට හරහට වෙලානෙ, දැන් වාහන හදන හැටි මේ වගේ හුරතල් වැඩ මේ සභාවේ තවදුරටත් තිබුනොත් කරන්න සූදානම් වෙන්න එපා කියලා තමයි කියන්නේ. අද යෝජනා අවශ්‍ය නැහැ. ආරම්භයේ දී යෝජනා දුන්නා. ආරම්භයේ දී අපි කතා කළා. සියලු වැරැදි සිදුවී හමාරයි. වාහන ගණන මෙතුමා පෙන්නුවා. අපි සියලු දෙනාම පෙන්නුවා අර මෙතුමා කිව්ව වගේ ගසා කාපු හැටි, ඒක නිසා මේ සියල්ල අතර අවුරුදු පහක් අපි මේ විදිහට ඇවිල්ල තියෙනවා. ඊළඟට ඔබතුමා කිව්වා, බලපත්‍ර දෙන්න බැහැ කියලා. මම මේක වගකීමෙන් කියනවා. ඕනෑම දේකට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ, රෝද කරත්තයක් තියාගන්නත් බලපත්‍රයක් ගන්න ඕන. ඒ වගේම බාර් එකක් දානවා නම්, තැබෑරුමක් ආරම්භ කරනවා නම්, සුරාබදු බලපත්‍රයක්, අලෙවි කිරීම සඳහා සුරාසැල් බලපත්‍රයක් ලබා ගන්නවා නම්, ප්‍රධාන බලවතා වෙන්නේ සභාපති. වෙළඳ බලපත්‍රයක් මෙතුමා විසින් ඉදිරිපත් කළේ නැත්නම්, කිසිසේත්ම වෙළඳාම තහනම් කරන්න බැහැ. ඒක නිසා මේ වෙලාවේ මම වගකීමෙන් කියනවා, ඒ අවස්ථාවට මම මුහුණ දුන්නා. වගකීමෙන් කියනවා, ඒ බලපත්‍රය අත්සන් නොකර නම් බැහැ කියලා. අත්සන් කළේ නෑ කියනවා නම්, ඔබතුමා ප්‍රකාශ කරන හුරතල් වචනයක්, ඒකයි මම කියන්නේ, බලපත්‍රය සඳහා ඔබතුමා අත්සන් කරන්න ඕන. සභාපතිවරයා හැටියට වෙළඳ බලපත්‍රය දුන්නේ නැහැ කියනවා නම්, ඒක සුරතල් වචනයක් විතරයි කියල නැවතත් කියනව.

**ගරු සභාපතිතුමා**
මම වෙළඳ බලපත්‍රයක් දුන්නේ නැහැ. අපෙන් ඉල්ලුවෙත් නැහැ.

**ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා**
ඔබතුමා දුන්නේ නැත්නම් ප්‍රශ්නයක් කර ගන්නත් එපා. වෙළඳ බලපත්‍රය නොදී වෙළඳාම් කරන්නත් බැහැ.

**ගරු සභාපතිතුමා**
බැහැයි කියන්න බැහැ. නීත්‍යානුකූලව ඉල්ලනවනම් නොදී බැහැ.

**ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා**
ජනතාව විරුද්ධ නම් මේ ප්‍රදේශයේ සුරාසැලක් දාන්න අවසර දෙන්න බැහැ.

**ගරු සභාපතිතුමා**
ජනතාව විරුද්ධ නම් දෙන්න බැහැ. තල්ගස්වල හරක් මස් කඩෙත් වැහුවා. පළාතේ සංඝයා වහන්සේලාගේ විරෝධතාවය මත. නමුත් උඩුගම බාර් එකක් දැම්මා. සභාව වශයෙන් අපි දැනුවත් නැහැ.

**ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා**
ඊලඟට මම මේ සභාවේ කතා කරනවා, මැතිවරණයක් තියන්නත් පුළුවන්, නොතියන්නත් පුළුවන්. ජනතා විමුක්ති පෙරමුණ බලාගෙන ඉන්නවා, හැබැයි අපි කියනවා, රනිල් වික්‍රමසිංහ රටේ ජනාධිපති වුණේ කෙසේද, ඒ න්‍යාය පත්‍රය අනුව, මේකේ සභාපති කවුරුහරි වෙනවා ඇති. සමගි ජන බලවේගයටවත්, ජනතා විමුක්ති පෙරමුණට වත් මුලසුන යන්නේ නැහැ කියලා මම වගකීමෙන් කියනවා. ඒ පිළිබඳව මතක් කරමින්, තමුන්නාන්සේලා සියළු දෙනාටම මැතිවරණයකට ආවත්, නාවත් අවුරුදු පහක් සහෝදරත්වයෙන් මේ සභාවෙ අපි වැඩ කළා. කවදාවත් වචන හුවමාරු වුණා මිසක, අපි අපේ මහත්මා ගතිය අවුරුදු පහක් පෙන්නල තියෙනවා. ඒක තමයි වැදගත් වෙන්නේ. වෙන සභාවල් වල පුවත්පත කියවන කොට, ඒ දකින අසෝබන සිද්ධි දිහා බැලුවම, අපි ආඩම්බර වෙන්න ඕන අපි මන්ත්‍රීවරු විසි හතක්, මේ නිලධාරී මඩුල්ලත්, එහා පැත්තේ වැඩකරන නිලධාරී මඩුල්ල කිසිම දවසක ඔවුන්ට අවහිරතාවයක් වෙන විදියට මෙතන කටයුතු සිදු වුණේ නැහැ. කවදාවත් මෙතන නීතිය ආරක්ෂා කරන වැඩක්, පොලීසියෙන් ගෙන්නන්න සිද්ධ වුණේ නැහැ. සමහර දියුණුයි කියන ප්‍රදේශවල සිද්ධි දිහා බැලුවම, අපි ඉතාමත්ම හොඳ මට්ටමක අවුරුදු පහක් කටයුතු කරල තියෙනවා. එහෙම නම්

ඒ ගෞරවය අපි සමස්ත සියලුම පක්ෂ විපක්ෂ සභාපතිතුමා, ලේකම්තුමිය ඇතුළු සියලු දෙනාට ඒ සියලු ගෞරවය මේ අවස්ථාවේදී පදු කර සිටිනවා. තමුන්නාන්සේලා බහුතරයක් මේ ඡන්දය ඉදිරිපත් වන මේ අවස්ථාවෙ ඔබ සියළු දෙනාටම ජයග්‍රහනය ප්‍රාර්ථනා කරනවා. සුභ අනාගතයක් ප්‍රාර්ථනා කරමින්, මම නිහඬ වෙනවා.

**ගරු සභාපතිතුමාගේ මූලාසන කතාව**

ගරු මන්ත්‍රීවරුන්ගෙන් අවසරයි. අද දින ගරු මන්ත්‍රීවරු කිහිප දෙනෙකුගේ අදහස් ප්‍රකාශ කිරීම තුළ ඉදිරිපත් කළ කරුණු වලට පිළිතුරු ලබාදීමට ප්‍රථම අප සභාවේ ගරු මන්ත්‍රී ප්‍රියන්තා ගුණසේකර මහත්මියගේ පියාගේ අභාවය පිළිබඳ සමස්ත සභාවේ සංවේගය පළ කරන ගමන්ම, ඒ පිළිබඳව whatsapp මාර්ගයෙන් මන්ත්‍රීවරු දැනුවත් කළ බවත් කියන්න කැමතියි. ඒ වගේම ගරු මන්ත්‍රීවරුනි, කෙළෙහිගුණ දන්නා ශ්‍රී ලාංකිකයන් වශයෙන් තවත් ශෝකයක් පල කරන්න කැමතියි. ඔබතුමන්ලාට මතක ඇති 2004 සුනාමිය, ඒ අවාසනාවන්ත සිදුවීමේ දී අප රටේ අවතැන් වූ ජනතාවට සහනයක් දෙමින්, තුර්කි රාජ්‍යයෙන් අපට තුර්කි සුනාමි ගම්මානය කියලා ගම්මානයක් සාදා දුන්නා. එදා ඒ සත්කාරය කළ රටේ අද ඇතිවී ඇති තත්වය පිළිබඳව ඔබතුමන්ලා මේ දිනවල ප්‍රවෘත්තිවලින් දකින්න ඇති. මිනිසුන් පනස්දාහක් පමණ මියගොස්, තවත් ලක්ෂ ගණනක් අවතැන් වී ඇති බවයි ප්‍රකාශ වන්නේ. ඒ පිළිබඳවත් අපි මේ අවස්ථාවේ ශෝකය ප්‍රකාශ කරමු.

ගරු මන්ත්‍රීවරුනි මම එසේ ප්‍රකාශ කළත්, දේශපාලනයේ නම් කෙලෙහිගුණ දත්, ඒවාට ගරු කරන පිරිස ඉතා සීමිතයි. අදත් මට මෙම සභාවේ දී එය දකින්න පුළුවන් වුණා. මන්ත්‍රීවරුනි, මම නිර්භයව එකක් කියන්නම්. වනමල් මන්ත්‍රීතුමාගෙන් ප්‍රකාශ වුන මෙම සභාව හොර ගුහාවක්ය යන ප්‍රකාශය තරයේ හෙලා දකිනවා. එතුමා ප්‍රකාශ කළ කරුණුවලට ගරු උප සභාපතිතුමා සහ අනිත් මන්ත්‍රීවරුන් උත්තර දුන්න කියලයි මම හිතන්නේ. එතුමා ප්‍රකාශ කළා වාහන අලුත්වැඩියා ඇස්තමේන්තුවක් සම්බන්ධව. මම මේ පිළිබඳව පරීක්ෂණයක් කරනවා. ඔබතුමා දන්න සියලු විස්තර ලබාදෙන්න. එහි වරදක් වී ඇත්නම් අදාළ නිලධාරීන්ට පමණක් නොව, මම ද ඕනෑම දඬුවමකට යටත් වීමට කැමතියි. ඔබතුමා දැන්ද දන්නේ සභා කැබ් රථයට යන වියදම, මෙය මා විසින් ලබා ගත්ත දෙයක් නොවෙයි, සියලු සභාපතිවරුන්ට ලබාදුන් වරප්‍රසාදයක්. වර්තමානයේ තෙල් මිල ගණන් ඉහළ යාම තුළ තමයි ඔය මුදල වියදම් වන්නේ.

ඒ වගේ එතුමා කියනවා මොනවද සභාවෙන් කළේ කියලා. මන්ත්‍රීතුමනි, මේක හොදට අහගන්න. අද ඇල් වතුර එකක් දුන්නත් face book දාන කාලේ. නමුත් මම මෙම සභාවේ කළ කී දෑ ෆේස්බුක් සමාජ මාධ්‍යවල හෝ බෝඩ් ගසා ප්‍රසිද්ධ වෙන්න ගියේ නැහැ. මාගේ හදවත පමණයි දන්නේ. උදාහරණ ලෙස ලක්ෂ 60ක පමණ වියදමකින් මාපලගම මහජන ක්‍රීඩාපිටිය, අතරමග දැනට නැවතී ඇති ලක්ෂ 650 ක පමණ මුදලින් ඉදිකරන ආදාහනාගාරය, ලක්ෂ දෙසීයක පමණ වියදමින් ඉදි කරන තල්ගස්වල වෙළඳ සංකීර්ණය, මේ කීපයක් පමණයි. නාගොඩ නගරය සංවර්ධන ව්‍යාපෘතිය (මේ වන විට මැනුම් කටයුතු කිරීමට ඇත) ප්‍රධාන නගර ආශ්‍රිත එල්ඊඩී විදුලි බල්බ් සවි කිරීම, පොදුවේ මාර්ග කාපට් කිරීම වැනි ව්‍යාපෘති මේ සියල්ල සිදුවෙද්දී තමයි ඔබතුමාලා අරගල කිරීම තුළ අතරමඟදී නැවතුණේ. කුරුඳු අක්කර දෙකක් සිටුවීම, අන්නාසි පැළ සහ අඹ පැළ සිටුවීම ආදිය. දැන්වත් ඔබතුමාට තේරෙනවද හොර ගුහාව කරපු දේවල් තව තියෙනවා. කාලය යන නිසා මම කියන්නේ නැහැ ඔබතුමා අවසන් වශයෙන් කීවා නැවතත් සභාපති වන හිතන්න එපා කියල මගෙ සභාපතිකම එය වෙතත් ෙසේ වෙතත් ඔබතුමාගේ මන්ත්‍රී කම රැකගන්නේ කියලා මම ඉල්ලනවා

ඒ වගේම සභා සතු පොළවල් මේ වන විට අඩු ලංසු වලට ටෙන්ඩර් ගියත් පොළවල් සංවර්ධනය කිරීමට ලක්ෂ ගණනක මුදල් ප්‍රතිපාදන ලබාගෙන සංවර්ධනය කළා. අද දින මෙම සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අලුත්වත්ත පොළ සම්බන්ධව, මම තමයි හිටපු නාගොඩ ප්‍රාදේශීය ලේකම් සමග කතා කරලා, එම ස්ථානය නිදහස් කරගන්න කටයුතු කළේ, මන්ද එම ස්ථානය වෙනත් අයකු විසින් අනවසරයෙන් ව්‍යාපාරයක් පවත්වාගෙන ගියා, පසුව මට දැන ගන්න ලැබුනා, එම ස්ථානය ප්‍රාදේශීය ලේකම් සතු ස්ථානයක් කියලා, ඒ අනුව එම ස්ථානයේ සති පොළක් දැමීම සුදුසුයි කියලා ඒ ගමේම අය කියපු නිසා මම ප්‍රාදේශීය ලේකම් සමඟ සාකච්ඡා කොට එම ස්ථානය නිදහස් කර ගත්තම තමයි සභාවේ මන්ත්‍රී

කෙනෙකු සමග පැමිණ ගම්වාසීන් තාවකාලිකව පොළක් දැමීමට මගෙන් අවසර ඉල්ලුවෙ. ඒ අනුව මාස තුනකට පමණ මම අවසර ලබා දුන්නා. ප්‍රාදේශීය ලේකම් සමඟ සාකච්ඡා කොට එය ඉදිරියේදී සාර්ථක පොළක් බවට පත් කිරීමට හැකිනම්, සභාව තීරණය කරන පරිදි එය පවත්වමු. ඒ වගේම වසන්ත මන්ත්‍රිතුමා ප්‍රකාශ කළ නිවාස ප්‍රශ්නය ඒ සම්බන්ධව ධර්මසිරි මන්ත්‍රීතුමා උත්තර ලබා දුන්නා. ඒ ගැන මං දන්නෙ නැති නිසා මම උත්තර දෙන්නෙ නැහැ.

ගරු මන්ත්‍රීවරුනි, ඒ වගේම අද දින සිදු වූ මිල ගණන් කැඳවීම් ඉදිරිපත් කිරීමේ ක්‍රමවේදය පිළිබඳව, ඔව් මමත් ඒක පිළිගන්නවා. නමුත් මන්ත්‍රීවරුනි, මෙම ඉදිරිපත් කිරීම සිදුවූයේ වඩාත් විනිවිද භාවයක් ලබා දෙන්නට මෙන්ම හදිස්සියේ ප්‍රසම්පාදන කමිටුව කැඳවීමක් කිරීමට නොහැකි වීමත් නිසයි. මේ සම්බන්ධව අදාළ නිලධාරිණිය කරුණු ඉදිරිපත් කළ පසු මා විසින් තමයි නියෝග කළේ මහා සභාවට ඉදිරිපත් කිරීමට, ඉදිරිපත් කිරීමේ දී ඇතිවූ ගැටලුව පිළිබඳව මගෙත් කණගාටුව ප්‍රකාශ කරනවා. මම නිතරම බලන්නේ සභාවේ මුදල් අනිසි විදියට වියදම් නොකර, විනිවිදභාවය එක්ක ගමන් කරන්න. මේවට විරුද්ධ අයත් මේ සභාවේ ඇති.

ඒවගේම අලුතින් ආරම්භ කරනවා යැයි ප්‍රකාශ කල මත්පැන්හල පිළිබඳව මම දැනුවත් වුනෙත් ඔබතුමාලා දැනුමත් වූ ආකාරයට මිස වෙනත් විදිහකට නොවෙයි. සහබන්දු මන්ත්‍රිතුමා ප්‍රකාශ කළ ආකාරයට මෙතැන නීත්‍යානුකූලව සභාවේ වෙළඳ බලපත්‍රය ලබාගෙන නැහැ. ප්‍රදේශයේ හාමුදුරුවරු විරුද්ධත්වයක් ප්‍රකාශකරලා තිබුණා, දැනට මෙම මත්පැන්හල ස්ථාපිත කරන ස්ථානය සම්බන්ධව මා දැනුවත් වූ ආකාරයට එය ජයසිංහාරාම පුරාණ විහාරස්ථානයට යන මාර්ගයේ පිහිටා ඇති ස්ථානයක්. ඒ පිළිබඳව අප ගැන විරෝධය තියෙනවා. මට පෞද්ගලිකව මත්පැන් වලට විරුද්ධ වන්න බැහැ. එහෙමනම් අපි රටේ ඇති මත්පැන්හල්වලට විරුද්ධ විය යුතුයි. මේ වන විට ඔය මොන දේකටවත් වෙළඳ බලපත්‍රය සභාවෙන් අරගෙනත් නැහැ. අපෙන් ඉල්ලුවෙත් නැහැ.

එහෙම නම් ගරු මන්ත්‍රීවරුනි, මේ අවසන් සභාවාරය කියලා කිව්වා. තවදුරටත් මේ සභාව ඇදෙයි. 69 ලක්ෂයකින් තෝරා එවලා, සිස්ටම් චේන්ජ් කරන්න ආපු එකම නායකයා තමයි ගෝඨාභය මහත්මයා. ඡන්ද ව්‍යාපාරයේදී යම් වෙනසක් වුණත්,නුනත්, රට යහ මගට හැරෙන්නට කටයුතු කරයි කියලා බලාපොරොත්තුවෙන්, ඔබ සියලු දෙනාටම ජයග්‍රහණය ප්‍රාර්ථනා කරමින්, මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

සභාපති,
නාගොඩ ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදී　　　　　　　　දිනය:-